# දහම් සරණ

## නොහොත්

# සූවිසි විවරණය

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

# සංස්කාරක හිමිගෙන්

මෙම දහම් පොත මම අම්බලන්ගොඩ ගල්දූව කල්‍යාණයොගාශ්‍රමයෙහි ක්‍රි:වර්ෂ 2007 අවුරුද්දේදී මට හමු වී කියවා බලා මතුපරපුරට ආදර්ශයක් දීම සඳහා මහත් පරිශ්‍රමයක් දරා පිටපත් කළෙමි. දිරා යාමෙන් සහ කාවුන් විසින් කා තිබීමෙන් ඇතැම් වචන වගන්ති පවා තිබුනේ නැත. එසේම මෙයට අවුරුදු 80 කට පෙර භාවිත කල වචන අදහස් තේරුම් ගැනීමට අපහසු විය. අවබෝධකරගත් ආකාරයට පොත සංස්කරණය කෙළෙමි. ධර්මය විකෘති කිරීමත් ගැටලු අර්ථ තැන් මගහැර යාමත් බලවත් පාපයක් බැව් දන්නා නිසාත් එම අර්ථ සහිත වගන්ති එම පොතේ තිබුණු ආකාරයටම මෙම පොතට ඇතුළත් කෙළෙමි.

විශේෂයෙන් මෙම මහා භද්‍රකල්පයෙහි කකුසඳ බුදුරජාණන් වහන්සේගේ විස්තරයට පෙර තිබෙන වාක්‍ය බොහොමයක්ම මම නොදනිමි. මෙය කියවූ ඔබද නොදනී. යම් කෙනෙක් එය දැනගත් දවසට සරල භාෂාවකට පරිවර්තනය කර ධර්ම දානය වශයෙන් සමාජගත කරන මෙන් මෙයින් ඉල්ලා සිටිමි.

මීට මෙතුති,
පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි,
ධම්මාරාම යෝගාශ්‍රමය,
උග්ගල්බොඩ,
ගම්පහ
19-09-2013

අකුරේගොඩ රතනසාර හිමි
අශෝකාරාම සේනාසනය
රන්වල
බෙලිගල්ල. (ස.ප.)

# දහම් සරණ නොහොත් සූවිසි විවරණය

දහම් සරණ කාව්‍යශේඛර ප්‍රදීපය කතෘ කේ.ඊ.බී වර්ණකුලසූරිය මහතාද ප්‍රකාශණ ජේ.ඩී ප්‍රනාන්දු, වේල්ලවීදිය, කොළඹ බුද්ධ වර්ෂ : 2475 ක්‍රිස්තු වර්ෂ 1931 දී මුද්‍රණය කර තිබූ පොතක් ක්‍රිස්තු වර්ෂ 2007 වර්ෂයේ මැද භාගයෙහි මා වෙත ලැබුණි. මහත් පරිශ්‍රයකින් පිටු පෙරළීමට පවා නොහැකි තත්වයෙන් තිබූ එයින් වර්තමානයේ අතුරුදහන් වෙමින් යන බුද්ධ ධර්මයේ වටිනා කොටස් මතු පරපුර උදෙසා මෙසේ ග්‍රන්ථාරූඪ කරමි.

මධ්‍යම රාත්‍රියෙහි මහභිණික්මන කරන අප මහ බෝසතාණන් වහන්සෙට තමන් වහන්සේගේ නුවර බැලීමට සිතක් පහළ වූ සේක. ඒ ක්ෂණයෙහිම මුළු නගරයම සිද්ධාර්ථ කුමාරයන් වහන්සේට දර්ශණය වනසේ මහී කාන්තා තොමෝ නගරය ඔසවා පාන්නී සකල නගරාභ්‍යන්තරය දර්ශණය වන්ට වූයෙන් ඒ දුටු කුමාරයන් වහන්සේ අතිශ්‍ය සතුටට පත්ව මෙම ස්ථානයේ ''කන්ථක නිවත්‍තන'' නම් චෛත්‍යස්ථානය (මතු) වන්නේ යයි වදාළ සේක.

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

මේ සසර වනාහි, ඉතා අව්‍යාවස්තිතය, ඉතා භයන්කරය, ඉතා සාදිනවය, ඉතා ව්‍යාකූලය, ඉතා දිගය, එතෙර විය නොහැක, ඒ කෙසේද යත්, කේෂර සිංහ රාජයෝ ගම් ඌරෝ වෙති, මහා බ්‍රහ්මයෝ කණාමැදිරියෝ වෙති. සක්‍ර දේවේන්ද්‍රයෝ චන්ඩාලයෝ වෙති. සාගරයෙහි වසන තල්මත්ස්‍යයින් ගැඩවිල් පණුවන් වෙති, මහා බලගතු රජවරු කුලීවැඩ කරන වහල්ලු බවට පත්වෙති. සසර බිය එසේය.

## තුම්යම්හි ලද තුන් විද්‍යාවය අරුණෝදයෙහි ලද සම්බුද්ධ රාජ්‍යය

භාග්‍යවතුන් වහන්සේ එදා රෑ මාරබල මැඩපියා ජය ශ්‍රී බෝමැඩ අරා වැඩ හිඳ ප්‍රථම යාමයෙහි (දසපැයෙහි) අනන්තා පර්යන්ත ලෝක ධාතුයෙහි සත්වයින්ගේ පෙර විසූ ස්කන්ධ පරම්පරාව දන්නා නුවණ යයි පූර්ව නිවාසානු ස්මෘති ඥාණයද, මධ්‍යම යාමයෙහි අසංඛ්‍ය ගණන් චක්‍ර වාටයන්හි පවත්නා

සකල වස්තූන්ම දර්ශණය වන්නාවූ දිව්‍ය චක්ෂුපයද, අවසාන දස පැයෙහිදී ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි ඥාණයබස්වා දස දහසක් සක්වල එක පැහැර ගර්ජනා කරවා අනුක්‍රමයෙන් සෝවාන් මාර්ගය, සෝවාන් ඵලය, සකෘදාගාමී මාර්ගය, සකෘදාගාමී ඵලය, අනාගාමී මාර්ගය, අනාගාමී ඵලය, යන මේ සතර මහ සතර ඵලයටද පැමිණ අරුණු නැගෙන වේලෙහි ස්වාසනා කෙලෙසුන් නසා ලොව්තුරා බුද්ධ රාජ්‍යයට පැමිණි සේක.

මෙසේ ස්වාමි දරුවන් ලොව්තුරා සම්මා සම්බුද්ධ රාජ්‍යයට පැමිණි වේලෙහි දස දහසක් සක්වල මගුල් ගෙයක් සේ ෂඩ් වර්ණ බුද්ධ රශ්මියෙන් සැරසී ගොස් දෙතිස්පූර්ව නිමිති පහළ විය.

**නමො තස්ස භගවතො අරහතො සමමා සම්බුද්ධස්ස**
**ධමෙමා හවෙ රකඛති ධම්මචාරිං**
**ධමෙමා සුචිණෙණා සුඛ 'මා' වහාති**
**එසා නිසංසො ධමෙම සුචිණේණ**
**න දුගගතිං ගච්චඡති ධමමචාරී ''යි**

ධර්මය තෙමෙ ඒකාන්තයෙන් දහමෙහි හැසිරෙන්නෙකු රකිති. ධර්මය තෙමෙ මොනවට පුරුදු කරන ලද්දේ ලෞකික ලොකොත්තර සියළු සැප ගෙනදෙයි. දහමෙහි හැසිරෙන තැනැත්තා දුගතියකට නොයයි. ධර්මය මැනවින් පුරුදු කිරීමෙහි මෙම ආනිසංස වෙයි.

## ''ධම්මං සරණං ගචඡාමි''

දහම් සරණ යෙමි. කෙබඳු වූ දහම් සරණද? යත්, අප තිලොගුරු ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේ සාරාසංඛය කල්ප ලක්ෂයක් පුරා සොයා වෙහෙසී අන්තයෙහි බෝමැඩ වජ්‍රාසනයෙහි වැඩ හිඳ සවනේ ගෙවා දත් කෙනෙහි පසක් කලාවූ දහම් සරණ යෙමි.

දහම් සරණ ග්‍රන්ථය මෙසේ ආරම්භ වන්නේ නමුදු හේ ආරම්භය පමණකි මෙතැන් සිට දක්වනුයේ අප මහ බෝසතාණන් වහන්සෙ දීපංකර පාදමූලයෙ ලත් විවරණය ආදි කොට ඇති සුවිසි විවරණය හා ජාතක ධර්ම කතාවොයි නොහොත් සම්බුද්ධ වර්ණනාවොයි එසේ හෙයින් බලන කල මෙම

කොටස වනාහි මේ මෙහි දහම් සරණ නාමයට නොව බුත්සරණ නාමයට උචිත නොවන්නේදැයි ප්‍රශ්ණයක් පහළ විය හැකිය. හේ නොමැනවි දහම් සරණ නාමයම අතිශයින් උචිත වේ. කුමක් නිසාද යත්, සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පුරා අප මහ බෝසතාණන් වහන්සේ අහස පොළොව ගැටලන සේ ගන්නා ලද මහත් ව්‍යායාමයෝ කුමක් නිසා වූද යත්, අන්කිසිවක් නිසා නොවේ. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම නම් වූ ත්‍රිලක්‍ෂණ ප්‍රකාශක සුවාසු දහසක් ධර්මස්කන්ධය සොයනු සඳහාම වේ. එහෙයින් ඒ මේ උතුම් ධර්මය සොයනු සඳහා යමෙක් කලාවූ අනන්ත වූ අපර්යන්තවූ ව්‍යාපාරයො ශතරාව සහශ්‍රාවයෙන් ප්‍රකාශවෙත්ද වර්ණිත වෙත්ද ? ඒ වූ පමණටම හේ සොයාගත් දෙයෙහි මහත්ඵවයම ගුණ සමුදයම වඩ වඩාත් උද්දීපත වන්නේමය. හේ කිව යුත්තක් නොවේ. නිරායාශයෙන් ලැබෙන දෙයෙහි අගය පිරිහෙන බැව් මෙනෙහි කිරීම මෙහි ලා මෙම කාරණය වඩාත් සුබාවබෝධ කෙරෙත්මය.

**නොමැදින සුවඳ විහිදෙන සොඳ සඳුන් හර**
**හිමවත වසන වැදි අඟනො කෙරෙති දර**

## "අමරවති" රාජධානිය

අකාල මරණයෙන් තොර වූ හෙයින්ද රූප සෞන්දයර්‍යාදි ගුණයන් කරන කොට දෙවියන් සමාන මනුෂ්‍යයන්ගෙන් ආකණීණ වූ හෙයින්ද නගරය හාත්පස වූ පරිබායෙහි අමර නම් ඇති මත්ස්‍යයන් ගහනව ඇති හෙයින්ද නගර සංරක්‍ෂණය සඳහා හාත්පස කල මනෝසීලාවණී ප්‍රකාරය **අමර** නම් යුත් මත්ස්‍ය රූප චිත්‍රකරණයෙන් සමලංකෘත හෙයින්ද "අමරවතී" නාමයට ව්‍යවහාර ප්‍රාප්ත වූ බැව් පෙනේ.

මෙයට සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකින් යට අමරවතී නම් වූ රාජධානියෙහි ඉසුරුමත් බ්‍රාහ්මණ වංශයක ආනන්ද නම් අග්‍ර පුරෝහිත බ්‍රාහ්මණයා හට දාව **"වසී"** නම් බැමිණිය කුසින් උපන් සුමේධ කුමාර තෙම තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන්ගෙන් වෙදත්‍රය සහිත සියළු ශිල්ප ඉගෙන නිමවා සිය ගණන් බ්‍රාහ්මණ කුමරුන්ට වෙදත්‍රය හැදෑරීමෙන් ආචාර්‍ය්‍ය භාවයෙහි පිහිටා ගෘහස්ථව වාසය කරන සේක. මෙසේ වසන කුමාරයාගේ දෙමාපියන් මිය පරලොව ගිය කල්හි වස්තු රක්ෂායෙහි නියුක්ත "රාශිවඩ්ඪක" නම් අමාත්‍යයා අනේකවිධ වස්තූන්ගෙන් පිරුණ ගබඩාවල දොර හරවා "ස්වාමිණි" මේ මහා ධන සම්පත්තිය ඔබ වහන්සේගේ මව් පිය මුතුන් මිත්තන්ගෙන් ඔබ වහන්සේට අයිතිව පවත්නේ යයි දක්වූ කල්හි ඥාණවන්ත

කුමාර තෙමේ සිතනුයේ අහෝ මාගේ දෙමව්පිය ආදි නෑයො මේ ධන රැස්කොට තබා මී බැඳපියා ඉන් කිසිවක් නොගෙන යන මී මැස්සන් මෙන් හිස් අතින්ම ගියේ ය.

මමත් එසේ යාම සුදුසු නැතැයි සිතා එකල රාජ්‍යය කරන්නා වූ රජතුමා වෙත ගොස් මෙම ධනය නම් රාගය, ද්වේශය, මෝහය යන මහා ගින්නකින් ඇවිලගෙන සිටියේ ය. අඥාණ වූ මේ සත්වයෝ ඝෝර විෂ වූ සර්පයකු ගන්නට උත්සහ කරන්නාවුන් සේ සකල දුක්ඛ නිධාන වූ පංචකාම ගුණයම අනුභව කරමින් සසර දුක් විඳිතැයි (කියා) වස්තුව තබා ගෙන සිටීමේ නොයෙක් ආදීනව ප්‍රකාශකොට මා සතු අනේක කෝටි සංඛ්‍යාත මහ ධනය පිළිගත මැනව යි දන්වා සිටිමුත් තොප සතු වස්තුව තොප කැමැත්තක් කරවයි කියා එම වස්තුව ප්‍රතික්ෂේප කළේය.

එවිට සුමේධ කුමාරයා තම වාසලට ගොස් අණබෙර ගස්සවා මුළු නුවරම දැනුවත් කර සියලුම වස්තුව දන් දී හුදකලාව වනගත වූ සේක. එවිට ශක්‍ර දිව්‍ය රාජයා විසින් විශ්වකර්ම දිව්‍යපුත්‍රයා ලවා ධාර්මික නම් පර්වතයට නුදුරු ස්ථානයක නිර්මිත කරන ලද ආරාමයක් සහ තවුසන් භාවිතා කරන පිරිකරද දැක එය පිළිගෙන ඍෂිප්‍රව්‍රජාවෙන් පැවිදිව වසන සේක් සැපයට කාරණාවූ සතුටට උත්පත්ති ස්ථාන වූ මාළිගා සම්පත් හැර අවුත් මා මේ පන්සලෙහි විසීම දෙවන ගිහිගෙයක විසීමකැයි එයින් වන අට මහා පළිබෝධයක් දැක එම පන්සල හැර දමා රුකක් මුලට එළැඹ එගසින්ම ගිලිහී බිම්හි වගුල පත්‍ර, පල ආහාර කොට සෙය්‍යාව හැර ඉඳීම්, සිටීම්, සක්මන් කිරීම් යන ඉරියව් තුනෙන්ම දිවා රාත්‍රිය ඉක්මවන්නේ සඳවසක් තුලදි පඤ්ච භිඥා අෂ්ඨ සමාපත්තීන් ඉපදවූ සේක.

එසමයෙහි ත්‍රෛලොක්‍ය තිලකවූ දීපංකර බුදු රජාණන් වහන්සේ 'සුදර්ශණ' මහා විහාරයෙහි වැඩ වසන සේක් රම්‍යගම් නුවර වාසී සැදැහැවත් ජනයෝ බුදු රජාණන් වහන්සේ කරා එළඹ පසඟ පිහිටුවා වැඳ ධර්මශ්‍රවණය කොට අවසානයෙහි හෙට දිනට බුදු රජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නය වෙත දානය පවරාගෙන මහ දන් සරහා නුවර අලංකෘත කොට මණ්ඩපයක් සහ බුදු රජාණන් වහන්සේ වඩනා මගද සරසන්ට පටන් ගත්තේය.

එකල්හි එම රම්‍ය නගරාකාශයෙන් වඩිනා සුමෙධ තාපස තෙම මාර්ගය සාදනා මිනිසුන් දැක ඔබලා කුමක් සඳහා මාර්ගය සරසන්නෙහිදැයි? අසා අපගේ භාග්‍යවතුන් වහන්සෙ සමග මහා සංඝ රත්නය වැඩමවීම පිණිසයයි කී කල්හි

එසේ නම් උපාසකවරුනි මටත් මේ පාරෙ කොටසක් සෑදීම සඳහා ඉඩ දෙන්නැයි ඉල්ලාගෙන තමා ද මග සෑදීමට පටන් ගත්තේය. එය අවසන් කිරීමට ප්‍රථම හාර ලක්‍ෂයක් පමණ භික්ෂු සංඝයා පිරිවරාගෙන සර්වඥයන් වහන්සෙ වඩිනු දක තාපස තෙමෙ ''මාගේ බුදු පියාණන් වහන්සෙගෙ සිරිපා මඩෙහි නොතැවරේවා....... බුද්ධාලම්බන ප්‍රීතියෙන් ඔද වැඩෙමින් කලල මත්තෙහි අඳුන් දිවි සම අතුරා ඒ මත අධෝමුඛව වැදහොත් සේක.

එවිට දීපංකර සර්වඥයන් වහන්සේ සවනක් බුදු රැසින් දිළිහි දිළිහී මඩගොහොරුව මත වැටී සිටි සුමේධ තාපසයන් දෙස බලා උග්‍ර තපස් ඇති මොහු මතු බුදු බව පතා වැදහොත් සේ යයි දිවැසින් බලන සේක් සතර අසංඛ්‍ය කල්ප ලක්‍ෂයකින් මත්තෙහි එය සිදුවන බව දක වදාරා මල් අටමිටකින්ද තාපසයන් පුදා නියත විවරණ ශ්‍රී දී වැඩිසේක.

## කොණ්ඩඤ්ඤ සම්බුද්ධ විවරණ කතා

මෙසේ ගාම්භීර්‍ය්‍ය වූ සියලු සත්වයන්ට ප්‍රියන්තර වූ කරුණා නිධාන වූ දීපංකර නම් තතාගතයන් වහන්සේ ගෙන් ප්‍රථම නියත විවරණ ශ්‍රී ලැබ සමතිස් පාරමිතාවන් අවබොධ කරගෙන දුක්ඛිත සංසාරයට බැස සත්වා වාසයෙහි කරුණාවත පතුරුවා දීපංකර බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් බුද්ධ ශූණ්‍යව එක් අසංඛයක් ගිය පසු අසංඛ්‍යයක් කල්ප බුද්ධ ශූණ්‍යව තිබීමෙන් පසු එක් කල්පයකදී නැවතත් අඳුර මකාගෙන සූර්‍ය්‍ය දිවයරාජයෙක් උදාවන්නාසේ **'කොණ්ඩඤ්ඤ'** නමින් බුදුරජාණන් වහන්සෙ නමක් සොළසා සංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පාරමිතාවන් පුරා තුසිත පුරයෙන් චුතව රම්‍යවතී නම් රාජධානියෙහි සකලාද්භත ප්‍රසුති කන්ද වූ 'සුනන්ද' නම් රජ්ජුරුවන් නිසා අති විශිෂ්ඨ සම්පත් පුෂ්ටීන් සර්වලෝක පූජිත වූ රාජවංශයෙහි 'සුජාත' නම් දේවියගෙ කුසෙහි පිළිසිඳ දසමසක් දා කරඬුවක වැඩහුන් ධාතුන් වහන්සේ නමක් සේ සිඳ මවුකුසින් බිහිව සැදී වැඩී 'සුරුචි' නම් අග්‍ර මහේෂින් කුසින් විජිත නම් පුත්රුවණ බිහිවූ දා මහභිනික්මන් කොට මහණව දසමසක් මහා වීර්‍ය්‍යය කොට වෙසක් මස මැදි පොහෝදා යශෝදරා නම් සිටුකුමරිය පිළිගන්වන ලද කිරිපිඬු දන්වළඳා සාලවනෙන් දිවා විවරණකොට සවස් වේලෙහි තමා සමග පැමිණි පිරිවරින් ඈත්වී සුචන්දක නම් ආජීවකයා දුන් තණ අටමිට සාලකල්‍යාණ වෘක්ෂ මූලයෙහි පනස් අටරියන් වජ්‍රාසනයෙහි චතුරංගවීර්‍ය්‍යධිෂ්ඨාන පූර්වාංගම වැඩ හිඳ සම්මා සම්බුද්ධත්වයට පැමිණ වදාළා දම්සක් පවත්වා ගම් නියම්ගම් වැඩ වදාරා 'චන්ද්‍රවතී' නම් රාජධානියට වැඩ වදාල සේක.

එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සෙ එනුවර 'විජිතාවි' නම් මහරජව සිටියදී බුදුරජාණන් වහන්සේ තම නුවරට වැඩිය බැව් අසා පෙරමග ගමන්කොට බුදුරජාණන් වහන්සෙ ප්‍රධාන මහා සංඝ රත්නය උදෙසා විහාර කරවා දී තුන්මාසයක් මහ දන් පිළිගන්වා ඇප උපස්ථාන කල සේක. එබඳු වූ ඒ සා මහත් වූ පුණ්‍ය සම්භාරයක් කරගත්තා වූ රජතුමාගේ මතු අනාගතය බලා මෙම දානයෙ ආනිසංස බලයෙන් ''අනාගතයෙහි ගෞතම නම් සම්‍යක්සම්බුද්ධ වෙයි'' කියා දෙවන නියත විවරණය ද ලත් සේක.

එබස් ඇසූ ඒ මහා පුරුෂයාණන් වහන්සේ ''මම අනාගතයෙහි ගෞතම නම් සම්‍යක් සම්බුද්ධ වෙම්ලා, බුදු බවට පත්ව සසර දුක් විඳින සත්වයන් දුකින් මුදත්යයි'' වදාල සේක. එසේ වූ මම මේ අස්තිරවූ මෙම රාජ්‍යයෙන් කවර ප්‍රයෝජනයක් ද ? රාජ්‍යය තත්වයෙහි ආලය අත්හැර බුද්ධ ශාසනයෙහි මහණව පිටත්‍රතය ඉගෙන පඤ්චාභිඥ අෂ්ඨ සමාපත්ති උපදවා ජීවිත පර්‍ය්‍යාවසානයෙහි බ්‍රහ්ම ලෝකයෙහි උපන්සේක.

මේ අපගෙ බුදු පියාණන් වහන්සේ විසින් සප්ත රත්න සම ලංකෘතවූ සතර සෘධියකින් යුක්ත වූ සතිස් යොදුනෙක්හි පැතිරගෙන සිටි මහා පරිවාර ඇති චක්‍රවර්ථි රාජ්‍යයනානාවිධ ශව ශත නිවීත වූ අමු සොහොනක්සේ හැර පියා බුද්ධ ශාසණයෙහි මහණව නොයෙක් ලෙස බෝධි සම්භාර ධර්මයන් පුරඥණය මුහුකුරා අන්තයෙහි වජ්‍රා සනයෙහි වැඩ හිඳ ස්වයමභූඥණයෙන් පසක් කළාවූ ධර්ම රත්නය සරණ යමි.

## මංගල සම්බුද්ධ විවරණ කථා

මෙසේ දසබල බල ගුණ මණ්ඩන කොණ්ඩඤ්ඤ නම් ශ්‍රී ඝන ශාසනාන්තර්ධානයෙහි පටන් තවත් එක් අසංඛ්‍යක් පුරා ලෝකයාට බුද්ධ කියන වචනයකුදු ඇසීමට තරම්වත් නැති අවාසනාවන්ත කාලයක් සත්ව වර්ගයා අඥාණ මහා සාගරයෙහි නිමග්න වූ කල්හි අඳුර ගෙවා ආලෝකයක් ගෙන එන සූර්‍ය්‍ය දිව්‍ය රාජයකු සේ එක් කල්පයෙක්හි බුදුරජාණන් වහන්සේලා සතර නමක් ලෝකයෙහි පහළ විය.

01. මංගල නම් බුදුරජාණන් වහන්සෙ නමකි
02. සුමණ නම් බුදුරජාණන් වහන්සෙ නමකි
03. රේවත නම් බුදුරජාණන් වහන්සෙ නමකි
04. ශෝභිත නම් බුදුරජාණන් වහන්සෙ නමකි

මෙහි පළමු වන මංගල නම් සර්වඥයන් වහන්සේ සොළසා සංඛ්‍ය කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි පාරමිතා පුරා තුසිත පුර ආයු පමණින් දිව්‍ය සම්පත් විඳ දේවතා ආරාධනා අනුව පස්මහ බැලුම් බලා එය සුදුසු කාළය බව දැන ආරාධනා කරන ලද එම දෙවියන්ට තම විමානවලට යාමට අවසර දී වදාලා උත්තර නම් නුවර උත්තර නම් මහරජාණන් වහන්සේ නිසා සෞභාග්‍යයේ ප්‍රතිභිම්බයක් වූ උත්තරා නම් දේවීන් වහන්සේගේ කුසින් බිහිව වැඩි වයසට පැමිණ සියළුම ස්ත්‍රී සම්පත්තියෙන් පරිපූර්ණවූ ප්‍රිය වූ 'යශස්වතී' නම් දේවීන් වහන්සේ ප්‍රධාන කොට ඇති දහසක් පුර ස්ත්‍රීන්ගෙන් සියළුම තුන් සෘතුවටම සැප සම්පත් මාළිගාවල දිව්‍ය සැප විඳිමින් සිටියදී සකල පූර්වනිමිත්ත දැක 'පාණ්ඩර' නම් අශ්වයා පිටින් මහාභිණිෂ්ක්‍රමණය කොට පැවිදිව මාස අටක් මහා වීර්‍යකොට වෙසක් මස පුර පසලොස්වක් පොහොය දින උත්තරා නම් නුවර උත්තර නම් සිටාණන්ගේ 'උත්තරා' නම් දියණිය විසින් පිළිගැන්වූ කිරි පිඬු දානය වළඳා සල්වනෙහි දිවා විහර කොට සවස් වේලෙහි උත්තර නම් ආජීවකයා විසින් දෙන ලද්දාවූ අට මිටක් තණ ගෙන 'නාග' බෝධිමූලයකට එළඹ පනස් අට රියන් වජ්‍රාසණයෙහි චතුරංග වීර්‍යාධිෂ්ඨානයෙන් වැඩ හිඳ මාර බලය විනාශකොට සම්‍යක් සම්බුද්ධත්වයට පත්ව තමන් වහන්සෙ බෝධි සත්ව භූමියෙහිදී දරුවන් දන්ගත් යක්‍ෂයෙකු තමන් වහන්සේ බල බලා සිටියදීම ඉඳුණු වැල ගෙඩියක් අතින් ගලවා මඳුළු කන්නා සේ දරුවන් දෙන්නා චර චර යන ශබ්දයෙන් කඩ කඩ කොට කන වේලෙහි එම යක්‍ෂයාගේ දෙතොලින් වැගිරෙන ලේ බල බලා මදකුදු දොම්නසක් නොකොට මෙම පාරමිතා බලයෙන් මා බුදු වූ කල්හි මාගේ ශරීර ආලෝකය දස දහසක් සක්වල එක පැහැර පැතිරේවායි කියා පැතූ ප්‍රාර්ථනාවට සුදුසුව ජීවමාණව වැඩ සිටි අනූදහසක් අවුරුදු මුළුල්ලෙහි දිවා රෑ වෙනසක් නැතිව ශ්‍රී ශරීරයෙන් ආලෝකය විහිදුවීය.

මෙසේ බ්‍රහ්ම ආරාධනායෙන් ගම් නියම් ගම් සියළු සතුන්ට හිතසුව පිණිස චාරිකා කරමින් වැඩ වසන කල අප මහ බෝසතාණන් වහන්සේ ගෞතම නමින් බුද්ධත්වයට පත්වන බවට ශ්‍රී මුඛයෙන් ලැබුණා වූ විවරණ තමාගේ හදෙහි තැන්පත්කර සමතිස් පාරමී පුරමි යි කල අධිෂ්ඨානයට හල

ආත්ම ප්‍රේමයට ද කල සත්ව කරුණාවටද එක සිතිවිලි මාත්‍රයක් පමණ විරෝධයක් නොකරමියි සිතමින් බෝධි සම්භාර ධර්මයන් පුරමින් ඇවිදිනාසේක් එසමයෙහි 'සුරුචි' නම් වූ එක් බ්‍රාහ්මන ගමක 'සුරුචි' බ්‍රාහ්මණ උත්තමයෙක්ව තථාගතයන් වහන්සේ වෙත එළඹ ධර්ම ශ්‍රවණය කර කෝටියක් භික්ෂූන් වහන්සේ ප්‍රධානකොට ඇත්තාවූ බුදු රජාණන් වහන්සේට දන් දෙමියි පවරා මාගේ සම්පත්තිය අධික හෙයින් දන් දෙමියි මෙතෙක් පරිවාරයෙන් යුක්තවූ තථාගතයන් වහන්සේට වැඩ සිටීමට සුදුසු ස්ථානයක් මට දුර්ලභයයි සිතා වදාළ කල්හි එම සිතිවිල්ල දැනගත් ශක්‍ර දෙවියෝ වඩු වෙසින් අවුත් දොලොස් යොදුන් ප්‍රදේශයක්හි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙහි ස්වර්ණ කාන්තිය පෙනෙනසේ කෝටියක් මහා සංඝ රත්නයට සුව පහසුව වැඩ හිඳීමට සුදුසු සප්ත රත්නමය ආසනයෙන් යුක්ත මණ්ඩපයක් සාදා දී දෙව්ලො ගිය කල්හි :-

එම මණ්ඩපයෙහි බුදුරජාණන් වහන්සේ සමග භික්ෂූන් වහන්සේලා වඩා හිඳුවා සතර මහා සාගරයෙහි ජලස්කන්ධය එක තැනකට ගලන්නාසේ චතුමධුරයෙන් යුක්ත මහා දන් සත් දිනක් පුරා දී අන්ත දවස් තෙල කෝටියක් භික්ෂූන් වහන්සේලාගේ පාත්‍රාපුරා එළඟිතෙල්, වෙඬරු, මී පැණි, හකුරු දී එතෙක් දෙනා වහන්සේට තුන් සිවුරු පූජා කල සේක. එම සිවුරුවල වටිනාකම කෙසේද ? යත් හැමදෙනා වහන්සේ කෙරෙන් පසු පස සිටි වහන්සේ ලද සිවුර කෝටියක් වටින්නේය. මෙසේ මහ දන් දුන්නාවූ අප මහ බෝසතාණන් වහන්සේද මෙම පුණ්‍ය කර්මය බලයෙන් මමද මතු බුදුබවට පත්ව නව ලොකෝත්තර සද්ධර්මයෙන් ප්‍රත්‍යක්ෂ කෙරෙම්වා' යි සිතා ධර්මයම පතා වදාළ සේක.

මෙසේ මහ දන් දුන්නාවූ මහා වීර්‍යයාණන් වහන්සේගේ උදාරත්වය දුටු ඒ මංගල නම් බුදුරජාණන් වහන්සේ ද මෙම මහා පුරුෂතෙම මෙසේ පිරිනැමුවා වු දානමය අනුහස් බලයෙන් මතු 'ගෞතම' නමින් සම්මා සම්බුද්ධත්වයට පත්වෙයි යනාදීන් දීපංකර බුදු රජාණන් වහන්සේ වදාළ පරිද්දෙන් විවරණ ශ්‍රී දී වදාළ සේක. ඒ ඇසූ මහා පුරුෂයාන් වහන්සෙ සර්වඥතා ඥාණයෙහි නිබඳ වූ මහෝත්සාහයෙන් තමන් වහන්සේගෙ ඇති සියල්ල බුදුපාමොක් මහා සංඝ රත්නයට සිව්පසය සඳහා පූජාකර එම බුද්ධ ශාසනයෙහිම මහණව පිටකත්‍රය ඉගෙන සතර බ්‍රහ්ම විහාර වඩා පඤ්චා භිඥ - අෂ්ටසමාපත්ති උපදවා බ්‍රහ්ම ලෝකය සදා වදාල සේක. මේ සා අති මහත් ධනස්කන්දයක් දන් දී ප්‍රාර්ථනා කලේ ශ්‍රී සද්ධර්මයම අවබෝධ වේවායි'' කියා.

## සුමන සම්බුද්ධ විවරණ කථා

මෙසේ තම පුත්‍ර දාන පාරමිතාවෙ බලයෙන් දස දහසක් සක්වල තම ශ්‍රී ශරීර ආලෝකයෙන් බැබළවූ මංගල බුදුරජාණන් වහන්සේගෙ පරිණිර්වානයත් ශාසන අන්තර්ධානයත් වී එක් අතුරු කපක් ගෙවී ගියතැන විශ්වලොකාධි ගමන ඇති 'සුමන' නම් සවාමි දරුවො සමතිස්පාරමි දම් පුරා සම්පූර්ණකොට තුසිතපුරයෙහි ඉපිද එහි ආයු පමණින් දිව්‍ය සැප සම්පත් විඳ දේවාරාධනාව පිළිගෙන පඤ්ච මහා විලොකනය කොට තුසිත ලොවින් චුතව දක්ෂම නම් නුවර 'සුදත්ත' නම් රජතුමාගෙ 'ශ්‍රීමති' නම් මහා දේවිය කුස පිළිසිඳ දසමාසාවසානයේ දී ප්‍රශව ශ්‍රීන් දස සහශ්‍රී ලෝකධාතුව සදාක්‍රමයෙන් යෞවනයට පැමිණ දස දහසක් පුර ස්ත්‍රීන්ගේ කම්සැප විඳිමින් කල් යවා 'වතංසිකා' නම් අගබිසව කුසින් අනුපම නම් කුමර රත්නය ප්‍රසවූ කල්හි සතර පෙර නිමිති දැක ගිහිගෙයි භය දැක දැන පැවිදි වීමේ උතුම්බව දැන ගෙන මහණව දසමාසයක් මහා වීර්‍ය්‍යය කොට වෙසක් මස මැදි පොහොය දින 'අනවම' නම් නුවර සියළු සම්පත්තීන්ගෙන් නිරූපම වූ 'නිරූපම' නම් සිටාණන්ගේ 'අනුජ' නම් දියණිය විසින් පිළිගන්වන ලද කිරිපිඬු වළඳා සල්වනයෙහි දිවා විවරණය කර සවස් යාමයෙහි 'අනුපම' නම් ආජීවකයා දුන් අටමිටක් තණ පිළිගෙන නාග බෝධිමූලයට එළඹ තිස්රියන් පමණ වජ්‍රාසනයෙහි චතුරංග වීර්‍ය්‍යාධිෂ්ඨාන කොට වැඩ හිඳ මාර බලය යටපත්කර පෙරයම, මැදියම, අළුයම වන විට ෂට් අසාධාරන නුවණින් යුතුව සම්මා සම්බුධත්වයට පත්ව සත් සති ගෙවා බ්‍රහ්මා ආරාධනාව පිළිගෙන දම්සක් පවත්වා සියළු සත්වයින්ට වැඩ සාදා දෙමින් වැඩ වසන සේක.

එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සේ භවයෙහි ඇවිදිනා සේක් නාග භවනයෙහි ප්‍රබලව 'අතුල' නම් නාග රාජව අඳුරුලොව ආලෝක කරවමින් වැඩ වසන 'සුමන' නම් බුදු රජාණන් වහන්සෙ ලොව පහළ වූ බව දැනගෙන බුද්ධාලම්බන ප්‍රීතියෙන් පිනාගොස් මා විසින්ද එම උත්තමයාණන් වහන්සේට පූජාවක් කළ යුතු යැයි සිතා නාග භවනයෙන් නික්ම සද්ධර්මය අසමි බුඬරූපය දකිමියි බුදු රජාණන් වහන්සෙ කෙරෙහි මහත් ආදර භක්තියෙන් යුක්තව දම්සභා මණ්ඩපයට ගොස් මහත් ගෞරවයෙන් යුක්තව වැඳ නමස්කාර කර සිවුරු ඇතුළු මහ දන් දෙමින්ද නොයෙක් පූජා භාණ්ඩයන් පූජාකර වෙනත් සම්පත්තියක් ප්‍රාර්ථනා නොකොට මෙම කුසල් බලයෙන් බුදු බවම ප්‍රාර්ථනා කළ සේක.

එවිට බුදු රජාණන් වහන්සේද මෙම මහෝත්තමයාට මෙම දානයෙහි පුණ්‍ය බලයෙන් මතු කවර සිඬියක් වෙත්දැයි බලා වදාරණ සේක් මතු ගෞතම නමින් බුඬත්වයට පත්වන බව දැන සිව්වනක් පිරිස මැද මේ මහා පුරුෂ තෙම එසෙ මෙසෙ කෙනෙක් නොව මතු අනාගතයෙහි මා සේම ගෞතම නමින් සම්බුඬත්වයට පත්ව විසිහතර අසංඛ්‍යක් සසර දුක්ඛිත සත්වයන් සංසාර දුකෙන් මුදවන සේකැයි නියත විවරණ ශ්‍රී දී වදාළ සේක.

එබස් ඇසූ අප මහ බෝසතාණන් වහන්සෙ මම අනාගතයෙහි බුදු වෙයි ඒ සඳහා දැඩි වීර්‍ය්‍යඋපදවා සමතිස් පෙරුම් දම් පිරීමෙහි දැඩි ගණය කොට වදාළ සේක. මෙසේ අපගෙ ගෞතම බෝසතානන් වහන්සේ නාගාත්ම භවයෙ සිට පොවා බුඬ ශාසනයෙහි මහා පරිත්‍යාග කොට මෙම ධර්‍මයම පැතූ පරිදි ඇසූ සත්පුරුෂයන් විසින් මෙසේ උත්තමයන් විසින් පතන ලද්දාවූ බුදු පසේ බුදු තිසෙවිත වූ චිත්ත ශුද්ධි කාරණාවූ සඬර්‍මයම සරණ යෙමියි දහම් සරණ යායුතු.

## රෙවත සම්බුඬ විවරණ කථා

මෙසේ සුමන බුදු රජාණන් වහන්සේ සියළු ලෝ සතුන්ට සෙත සාදා සියළුම බුඬකෘතයන් නිමවා පරිනිර්‍වාණ ධාතුවෙන් පිරිණිවන් පෑ කල්හි ශාසනයද ක්‍රමයෙන් අන්තර්ඬානයට ගිය කල්හි ක්‍රමයෙන් එක් බුඬාන්තරයක් ඉක්ම වූ කල්හි සමත්‍රිත් පාරමිතා පූරණ සුමන බුදු රජාණන් වහන්සේගේන් පසු ලොව පහල වන ඊ ළඟ බුදු රජාණන් වහන්සෙ වන 'රෙවත' බුදු රජාණන් වහන්සේට පාරමී පූරණ බෝසතාණන් වහන්සෙ තුසිත පුර සිට දේවාරාධණාවෙන් පසු පස්මහ බැලුම් බලා බුදු වීමට සුදුසු කාලය බව දැන තුසිත පුරෙන් චුතවී විපුල නම් රජතුමාගෙ කුලයෙහි 'විපුලා' නම් අගමෙහෙසීන් වහන්සේගෙ කුසෙහි පිළිසිඳගෙන දසමාසයෙන් ප්‍රසව ක්‍රමයෙන් වැඩී සුදර්ශණා දේවීන් වහන්සේ කුසින් වරුණ නම් කුමාරයාණන් වහන්සෙ බිහි වූ කල්හි මහා පරිවාරයෙන් ආජාණීය රථයෙන් මහාභිනිෂ්ක්‍රමණය කොට මහා පිරිස් සමග එක්ව මහණව මාස හතක් මහා වීර්‍ය්‍යය කොට වෙසක් මස මැදි පොහෝදින 'යශොදරා' නම් සිටු දූවණිය පිළිගන්වන ලද කිරිපිඬු වළඳා සල්වනෙහි දිවා විවරණය කොට සවස් වේලෙහි වරුණ්ධන නම් වූ ආජීවකයා විසින් දෙන ලද තණ පිළිගෙන නාග බෝධිද්‍රමොපසජර්ණය කොට පසළොස්රියන් වජ්‍රාසනයෙහි වැඩ හිඳ මාර පරාජය කර සම්මා සම්බුද්ධත්වයට පැමිණ බ්‍රහ්මාරාධනයෙන් ධම්මචක්ක පවත්වන සූත්‍රයෙන් සසර දෝෂ පෙන්වා වදාලා ලෝකාර්ථයෙහි වසන සේක.

එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සෙ සමතිස් පාරමිතාවන්ගෙ අඩුතැන් පුරවමින් ජාතියෙන් ජාතියෙහි සංසරණය කෙරෙමින් රම්‍යවති නම් නුවර 'අතිදෙව' නම් බ්‍රාහ්මණව චාතුර්වේද විද්‍යස්ථාන මහා සාගර පාරගතව නානානු භාවයෙන් වාසය කරමින් බුදු රජාණන් වහන්සෙ ලොව පහළ වූ බව දැන භක්ති ප්‍රසාද උපදවා වැඩ සිටින ස්ථානය වෙත ගොස් මෙත් සොලොස් දහසකින් ස්තුතිකොට වදාළසේක. ඉන් අනතුරුව තමන් වහන්සේගෙ දහසක් වටිනා උතුරු සළුව පූජකොට වදාළ සේක. මෙබඳු වූ ස්තුතියක් කොට පූජාවක් කොටද අනිකක් නොපතා මෙම පුණ්‍ය බලයෙන් මෙම භාග්‍යවතුන් වහන්සෙ විසින් අවබෝධ කරගත්තාවූ යම් ධර්මයක් වෙත්ද එම ධර්මයම මා හටත් අවබෝධ වේවා...යි පැතූ සේක.

එම තථාගතයන් වහන්සේද ප්‍රාර්ථනාව දැන " මේ මහා පුරුෂතෙම මට කල ස්තුතියෙහි හා පූජායෙහි අනුහසින් මතු සර්ව ලොකොත්තම වූ ගෞතම නමින් බුඬත්වයට පත්වෙයි" යනාදීන් දිපන්කර සර්වඥයන් වහන්සෙ වදාළ පරිද්දෙන් විවරණ ශ්‍රී දි වදාළ සේක. අප මහ බෝසතාණන් වහන්සේද රෙවත බුදු රජාණන් වහන්සේගෙන් ලද නියත විවරණ අසා මතු බුදු වෙමියි යන අදහසින් සමතිස් පාරමිතා තව තවත් ශක්තිමත් කර ගනිමි යි ඉටා ගත් සේක.

## සොභිත සම්බුද්ධ විවරණ කථා

මෙසේ රෙවත බුදු රජාණන් වහන්සේද පිරිණිවී කල්හි ශාසනයද ක්‍රමයෙන් අන්තර්හිත වූ කල්හි තවත් බුද්ඬාන්තරයක් නොහොත් අතුරු කල්පයක් ඉක්ම ගියපසු සතර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමිතා ඇති අසරණ සරණ වූ පරදුක්ඛ දුක්ඛිත වූ සංසාර ගත සත්වයින් දුක් සසරින් එතෙර කරවන 'සොභිත' නමින් බුදු රජාණන් වහන්සේ ලෝ පහළ වී ලෝකාර්ථ කොට වදාරණ සේක. එම බුදු රජාණන් වහන්සේ බුද්ඬත්වයට පත්වීමට පෙර තුසිත දෙව්ලොවින් චුතව 'සුධර්ම' නම් මහරජාණන් වහන්සෙ නිසා 'සුධර්මා' නම් දේවීන් වහන්සේගෙ කුසෙහි පිළිසිඳ දසමස් ඇවෑමෙන් බිහිව වැඩී 'අකිල' නම් දේවීන් වහන්සෙ හා සරණ බන්ධනය වී අවුරුදු දස දහසක් කල් ගියපසු පුරුෂ සිංහ වූ 'සිංහ' නම් කුමාරයන් මව් කුසින් බිහිවූ දින සතර පෙර නිමිති අවබෝධ කරගෙන වැඩ ප්‍රාසාදයෙහිම මහණව සත් දවසක් මහා වීර්‍ය්‍යකොට වෙසක් මස මැදි පොහෝදා 'අඛිල' මහාදේවීන් විසින් පූජාකරන ලද කිරිපිඬු වළඳා ප්‍රාසාදයෙන් බැස 'නාග' බොධි මූලයට නික්ම වජ්‍රාසනාරූඪව පශ්චිමයාම සමන්තර සමාධිගත සම්‍යක් සම්බොධි ඇතිව ක්‍රමයෙන් අළුයම් වෙලෙහි සම්මා සම්බුඬ රාජ්‍යයට පත්වූ සේක.

එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සෙ 'රම්‍යවති' නම් රාජධානියෙහි 'සුජාත' නම් බ්‍රාහ්මණව සිටින කාලයෙහි බුදු රජාණන් වහන්සෙ ලො පහළ වූ පුවත දැනගන්ට ලැබී මහත් සතුටට පත්ව බුදු රජාණන් වහන්සෙ කරා එළඹ බණ අසා තුණුරුවන් සරණගොස් නානාවිධ මහදන් පූජා කර මහත් පිං රැස්කරගෙන දෙව් මිනිස් සැප කිසිවක් ප්‍රාර්ථනා නොකොට නිවන් දක්නාතුරු බුදු රජාණන් වහන්සෙ දේශණාකරන ලද ශ්‍රී සඬර්මයම අවබෝධ වේවා යි ප්‍රාර්ථනා කල සේක.

බුදු රජාණන් වහන්සේද මහා උත්තමයන්ගෙ අනාගතය බලා මෙම මහා පුරුෂයාණන් එසේ මෙසේ කෙනෙක් නොව මතු අනාගතයේදී 'ගෞතම' නමින් ලොව්තුරා බුද්ධත්වයට පත්වන බවට නියත විවරණ ශ්‍රී වදාළ සේක. එය ඇසූ අප මහ බෝසතාණන් වහන්සේද දිවි හිමියෙන් පින්දහම් කරගනිමින් දහම් සරණම පැතුසේක.

සොභිත බුදු රජාණන් වහන්සේගෙ පිරිණිවීමෙන් පසු කල්ප අසංඛ්‍යයක් මුළුල්ලෙහි කිසි බුඬොත්පාද මහෝත්සවයක් ලෝකයෙහි ඇති නොවීය. එම නිසා මෙය කල යුක්තය, නොකල යුක්තය, සුගතිමාර්ගය, දුගති මාර්ගය, මෙය හොඳ යහපත් ක්‍රියාවක්, මෙය නරක ක්‍රියාවක් යනු නොදත් කමින් අඥානවූ ලොවට බුද්ධාදිත්‍ය විගමයෙන් ඒ සා දීර්කාලාන්තරයක්ම අඳුරු කාල පරිච්ඡේදයක්ව පැවැතුනි.

එසේ එක් අසංඛ්‍යයක් කල්ප මුළුල්ලෙහි තිබුණු අඳුර දුරු කරමින් සියළු සත්වයන්ට හිත සුව පිණිස, වැඩ පිණිස, නැවතත් එක් කල්පයක් තුල බුදු රජාණන් වහන්සේලා තුන්නමක් ලෝ පහළ වූ සේක.

**01. අනොම දස්සී බුදුරජාණන් වහන්සේ**
**02. පදුම බුදුරජාණන් වහන්සේ**
**03. නාරද බුදුරජාණන් වහන්සේ**

එම කල්පයෙහි ප්‍රථමයෙන්ම 'චන්ද්‍රවතී' නම් රාජධානියෙහි 'යශවත්' නම් වූ මහරජාණන් වහන්සේ නිසා 'යශොධරා' නම් දේවීන් වහන්සෙගෙ කුසෙහි පිළිසිඳගෙනපිළිසිඳගත් දින පටන් අසූරියන් තැන්හි රෑ දහවල් වෙනසක් නොමැතිව සඳ හිරු දහසක් පෑවාසේ ආලෝකමත් විය. මෙසේ

මව්කුසින් බිහිව තරුණ වයසට පත්ව 'ශ්‍රීමති' නම් දෙව්දුවක් හා සමාන රූප ලක්‍ෂණයෙන් කුමාරිකාවක් සමග විවාහ බන්ධනයට පත්ව අවුරුදු දස දහසක් ගිහිසැප විඳ සතර පෙර නිමිති දැක එම දේවිය කුසින් 'උපවාන' නම් පුතණුවන් බිහි වූ දින රන්සිවි ගෙයකින් මහාභිනිෂ්ක්‍රමණය කොට තුන්කෝටියක් පමණ මනුෂ්‍යයන් එක්ව මහණව දසමාසයක් මහා වීර්‍ය්‍යය කොට වැඩසිටි කල්හි 'අනුපම' නම් බ්‍රාහ්මණ ග්‍රාමයෙහි සිටු දියණි කෙනෙක් විසින් පිළිගන්වන ලද්දාවූ කිරිපිඬු දන්වළඳා දිවා විහාර කොට 'අනුපම' නම් ආජීවකයා පිළිගැන්වූ තණ අටමිට පිළිගෙන අර්ජුන බොධිමූලයට වැඩ තිස්අටරියන් වජ්‍රාසනයෙහි වැඩ හිඳ මාර පරාජයකර පෙරයම, මැදියම, අළුයම යන තුන්කල්හි ෂට් අසාධාරණ ඥාණය ලබා සම්බුඬරාජයයට පත්ව සත්සති ගෙවා බ්‍රහ්ම ආරාධනාව පිළිගෙන ධම්සක් පවත්වා බැලූ බැලූ සත්වයන්ගෙ දැස පුරන ලද පාරමිතා බලයෙන් රුව අඳිමින් සියලු ලොව එක ධර්ම ශාලාවක් සෙයින් කුලයෙන් කුලයෙහි ග්‍රාමයෙන් ග්‍රාමයෙහි මෝහ නිද්‍රා නැති කරමින් ධර්මදේශනා කරමින් වැඩ වසන සේක.

එසමයෙහි අප මහ බෝසතාන් වහන්සේ බෝධි පාක්ෂික ධර්මයන් පුරමින් මාරයාගෙ විරෝධය මැඩලමින් යක්‍ෂ සේනාධිපතිව දිවින අතර බුදු රජාණන් වහන්සෙ නමක් ලෝ පහළ වූ බැව් අසා සතුටු සිතින් ගොස් වැඳ නමස්කාර කර අලංකාර දාන ශාලාවක් සාදා මහ දන් දුන්නේය. එම දාන අවසානයෙහි කරගත් පුණ්‍යකර්මය සිහිපත් කර මෙපිං බලයෙන් තිවන් දක්නා ජාති දක්වාම මට දහම් සරණයම වේවා...'' යි ප්‍රාර්ථනා කල සේක. එවිට තථාගතයන් වහන්සේ ද මතු අනාගතය බලා මොහු ඒකාන්තයෙන්ම මා සේම සම්මා සම්බුඬත්වයට පත්ව අපමණ සත්වයන් සසර බන්ධනයෙන් මුදවන්නේය යි දැක දීපංකර බුදු රජාණන් වහන්සේගෙ පටන් ලෝ පහළ වූ අනෙකුත් බුදු රජාණන් වහන්සේලාගෙන් සේම නියත විවරණ ශ්‍රී ලැබූ සේක.

## පදුම සම්බුද්ධ විවරණ කථා

මෙසේ අනෝමදස්සි බුදු රජාණන් වහන්සේගෙ පිරිණිවීමත් ශාසන අන්තර්ධාන වීමත් සමග එම අතුරුකප ගෙවා දෙවන අතරුකප පුරණ ලද සමතිස් පෙරුම් ඇති නිරූපම වූ බුඬ ශ්‍රී පත්ම වූ විකසිත මුඛ පද්ම වූ 'පදුම' නම් ස්වාමිදරුවො 'චම්පක' නම් පූරවරයෙහි සකල ගුණයෙන් යුත් අසම නම් මහරජාණන් වහන්සෙ නිසා 'අසමා' නම් දේවියගෙ කුසේ පිළිසිඳ දසමසක් ගෙවී ගිය තැන දස දහසක් සක්වල ආලෝකමත් කරවමින් වෙසක් මස මැදි

පොහෝ දින බිහිව ඇති දැඩි වී 'උත්තරා' කුමරිය සමග සරණ බන්ධනයට ඇතුලත්ව අවුරුදු දස දහසක් ගිහි සැප විඳ උත්තරා නම් දේවීන් වහන්සෙ 'රම්‍ය' නම් කුමරු බිහි කල දා සතර පෙර නිමිති දර්ශණයෙන් සසර කලකිරී පැවිද්දෙහි කැමතිව අජාණීය රථයෙන් මහාභිණිෂ්ක්‍රමය කොට මහණව මාස අටක් මහා වීර්‍ය්‍ය කොට වෙසක් මස මැදි පොහො දින 'ධඤ්ඤාවතී' නම් ග්‍රාමයෙහි ධන්‍ය ශ්‍රෙෂ්ඨිහුගෙ දූ කුමරිය වූ 'ධන්‍යවතිය' කුමරිය විසින් පිළිගන්වන ලද්දාවූ කිරිපිඬු වළඳා දිවා විහාරකොට මහාශොණ බෝධිමූලයට එළඹ තිස් අටරියන් වජ්‍රාසනයෙහි වීර්‍ය්‍යාධිෂ්ඨානව වැඩ හිඳ මාර පරාජය කර සර්වඥතාඥාණය උපදවාගෙන පෙර බුදු රජාණන් වහන්සේලා පවත්වා ගෙන ආ සියළුම බුද්ධ කෘත්‍යයන් එලෙස සිද්ධ කරමින් වැඩ වසන සේක.

එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සෙ පාරමී පුරමින් සසර සැරිසරන්නාවූ එම ආත්ම භාවයෙහි සිංහ රාජයෙක්ව උපන. එම සිංහ රාජයා වනයෙන් වනයට ගමන් කරන අතර භාග්‍යවත් අර්හත් පදුම බුදුරජාණන් වහන්සෙ වැඩ සිටි ස්ථානයට පැමිණ සසර පුරුද්ද අනුව බුදු රජාණන් වහන්සෙ කෙරෙහි මහත් ගෞරවයෙන් ආදරයෙන් කීකරුව බලු පැටියකු සේ සත්දිනක් දිවා රෑ නොනිදා කිසි අහරක් පානයක් ගැන නොසිතා නොනිදා ගල් රූපයක් සේ නේත්‍රා පූජා කරමින් බලා සිටියේ ය. එම සත් දිනම බුදු රජාණන් වහන්සේද නිරෝධ සමාපත්තියට සමවැද එයින් නැගිට මෙසේ සත්දිනම නිරාහාරව නේත්‍රා පූජාකර සිටි සිංහ රාජයාගෙ අනාගතය දැක වදාරණ සේක් මතු අනාගතයේදී 'ගෞතම' නමින් සම්‍යක් සම්බුද්ධ රාජ්‍යයට පත්වන බවට නියත විවරණ ශ්‍රී දී වදා සේක.

## නාරද සම්බුද්ධ විවරණ කථා

මෙසේ පදුම බුදුරජාණන් වහන්සේ ලෝ පහළ වූ අතුරු කප ගෙවා ඊළඟ අතුරුකප 'නාරද' නම් සම්මා සම්බුදු රජාණන් වහන්සෙ සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පෙරුම්පුරා තුසිත දෙව්ලොවින් චුතව 'සුදෙව' නම් මහරජාණන් වහන්සෙ නිසා 'අනවමා' නම් දේවීන් වහන්සේගේ කුසෙහි පිළිසිඳ ගෙන ප්‍රසව ක්‍රමයෙන් හැදී වැඩී සියළු යස ඉසුරු සැපත් විඳිමින් කල්ගෙවීමේදී නවදහසක් අවුරුදු ගෙවා 'විජිතසේන' නම් අගමෙහෙසිය කුසින් 'නන්දනොත්තර' නම් කුමාරයන් වහන්සෙ උපන් කල්හි සසර කළකිරී පැවිද්දෙහි කැමති වී පිරිවර සේනාව සමග ශ්‍රී පාදයෙන්ම උයනට වැද සත් දවසක් මහා වීර්‍ය්‍ය කොට වෙසක් පුර පසලොස්වක් පොහොය දින විජිතසේන

අගමෙහෙසිය වහන්සෙ විසින් දෙන ලද කිරිපිඬු දන් වළඳා එම උයනෙහිම දිවා විවරණය කොට සවස් වේලෙහි එහි උයන් පාලකයා විසින් දෙන ලද තණ අට මිට පිළිගෙන 'මහාශොණ' බෝධිමූලයට එළඹ පනස් අටරියන් උස වජ්‍රාසනයෙහි වැඩ හිඳ තුන්යම කාලයන්හි මාරබල බිඳ ෂට් අසාධාරණ ඥාණයන් ලබා අළුයම් වේලෙහි බුඬ රාජ්‍යයට පත්වී මහාකරුණාවෙන් සංසාරගත සත්වයන් සසර දුකෙන් මුදවීමේ කාර්‍යයෙහි යෙදී වැඩ සිටි සේක.

එසමයෙහි අප බෝසතාණන් වහන්සෙ තාපස ප්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ඨ සමාපත්ති උපදවා හිමාල වනයෙහි වැඩ වසන සේක. එකල්හි 'නාරද ' නම් සම්මා සම්බුදු රජාණන් වහන්සෙ අප බෝසතාණන් වහන්සේට අනුග්‍රහ පිණිස සිව්වනක් පිරිස සමග අප මහ බෝසතාණන් වහන්සෙ වැඩ සිටි ආරාමයට වැඩිසේක. එවිට බෝධිසත්වයන් වහන්සේද සසර පුරුද්ද අනුව බුදු රජාණන් වහන්සෙ ප්‍රමුඛ සඟ පිරිවරද, උපාසක පිරිසද දැක මහත් සොම්නසට පත්ව පෙරමගට වැඩ තමන් වහන්සේගෙ අභිඥා බලයෙන් බුදු රජාණන් වහන්සේට වෙනම ලැගුම් හලක්ද අනෙක් පරිවාර සේනාවට සුවපහසු ලැගුම් හල්ද මවා පූජාකර පසුදා පහන් වනතුරු ධර්‍ම ශ්‍රවණය කළසේක.

නොයෙක් ආකාරයෙන් බුදු රජාණන් වහන්සේට ස්තුති ශොත්‍ර ගායනාකර පහන් වූ කල උතුරුකුරු දිවයිනට වැඩ බුදු රජාණන් වහන්සේ ප්‍රමුඛ පිරිසට දානය ගෙන අවුත් සත් දවසක් මුළුල්ලෙහි නොයෙක් පුද පූජාවන් පවත්වා අවසානයේ මෙසේ ප්‍රාර්ථනා කල සේක. ''මා විසින් කරන ලද මෙම කුසල බලයෙන් මතු මෙම සර්වඥයන් වහන්සේ සේම ලෝකෝත්තර සඬර්‍මය ප්‍රත්‍යක්‍ෂකොට හෙම්වා'' යි ප්‍රාර්ථනා කළ සේක. බුදු රජාණන් වහන්සේද සිතු සිතිවිල්ල දැක මේ මහා වීර තාපසයාණන් වහන්සෙ එසේ මෙසේ කෙනෙක් නොව මතු අනාගතයෙහි මා සේම 'ගෞතම' නමින් බුදු බවට පත්ව අනන්ත අප්‍රමාණ සත්ව සංහතියක් සසර බන්ධනයෙන් මුදවාගෙන බොහෝ ලෝවැඩ සලසාදෙන උත්තමයාණන් වහන්සෙ කෙනෙකැයි මහ පිරිස මැද විවරණ ශ්‍රී දි වදාළ සේක.

## පදුමුත්තර සම්බුද්ධ විවරණ කථා

මෙසේ නාරද සම්බුඬ ශාසනය අන්තර්ධාන වූ පසු එක් අසංඛ්‍යයක් කප් මුළුල්ලෙහිම නැවත බුඬ කියන වචනයකුදු ඇසීමට නොමැතිව ගෙවී ගිය පසු මෙයට කල්ප ලක්‍ෂයකට ඉහතදී එක් මහා වීර දිව්‍ය රාජයකුට තුෂිත පුරදී දේව ආරාධනාව ලදින් සකල ලෝක සත්වයන්ට සසර දුකින් මිදීමට විශ්ව ඬ

ලෝකයාගෙ පිරිසිදු ස්නානයට හේතු සම්පතක් වූ එක් අසංඛ්‍යක් ලෝකයෙ අඳුර නිවා ලොව්තුරා බුඬ රාජ්‍යය සඳහා තුසිත පුරෙන් පස් මහ බැලුම් බලා හංසවතී නම් රාජධානියෙහි 'ආනන්ද' නම් රජතුමා නිසා 'සුජාතා' නම් දේවිය කුස පිළිසිඳ ගෙන දසමාසයක් ගෙවීමෙන් බිහිව දස දහසක් සක්වලට ආලෝකය පතුරවමින් 'පදුමුත්තර' යන නම් ලදින් දෙව් සැප වන් ගිහි සැප විඳ 'වාසුදත්තා' නම් ආගමෙහෙසිය කුසින් 'උත්තර' නම් කුමරුන් බිහිකල දිනදී සතර පෙර නිමිති දක ගිහි සැප ගැන කලකිරී පැවිදි වී සසර දුකින් තමන් වහන්සෙත් මිදී සියළු ලෝක සත්වයනුත් මුදවම්යි සිතා තම වැඩ සිටි ප්‍රාසාදයෙන් මහා භිනිෂ්ක්‍රමය කොට කැටුව ගිය පරිවාරයෙහි ස්ත්‍රීන් පිටත්ව සෙසු පුරුෂයින් සියල්ල සමග මහණව සත් දවසක් මහා වීර්‍ය්‍යය කොට වෙසක් මස පසළොස්වක් පොහෝ දින 'රුචිනන්ද ' නම් සිඨානන්ගේ දියණිය විසින් පිළිගන්වන ලද කිරිපිඬු දානය වළඳා සල් වනයෙහි දිවා විවරණය කොට 'සුචිත්‍ර' නම් ආජීවකයා පිරි නැමූ තණ අට මිට පිළිගෙන 'සල්ලබොධිය' පැදකුණු කොට තිස් අටරියන් වජ්‍රාසනයෙහි වැඩ හිඳ ''මාගෙ මස්, ලේ, වියලේවා'' යි සම්මා සම්බොධියට පැමිණ මිස මෙයින් නොනැගිටෙම්යි අනෙකුත් බෝධිසත්වයින් වහන්සේලා සේම ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව සිට මාර බල සිඳ බිඳ දමා තුන්යම ගෙවා අරුණෝදයත් සමග සම්මා සම්බුඬ රාජ්‍යයට පැමිණ වදාළ සේක. කෙමෙන් සත්සති ගෙවා බ්‍රහ්ම ආරාධනාව අනුව ඒකා සංඛ්‍යාකල්පයක් බුඬ කියන වචනයකුදු නොමැතිව තිබූ ලොවට දම්සක් පවත්වා ලෝකය ආලෝකමත් කිරීමට පටන් ගත් සේක.

එසමයෙහි අප බෝසතාණන් වහන්සේ බොහෝ වස්තු හිමි ජටික නම් රාෂ්ඨිකව තමන් වහන්සේගෙ අනන්ත ගුණ නුවණ මෙහෙයවා බුදු ගුණයෙහි ප්‍රසන්නව බුදු පාමොක් සංඝයාට මහ දන් දී තුන්සිවුරු පූජාකර මාගෙ මෙම දානමය කුසල බලයෙන් මෙම බුදු රජාණන් වහන්සේ සේම සියළු සත්වයාගෙ දුංඛ නිර්වාපනයෙනි දිව්‍යයුෂධ සඬම්යම අවබෝධ වේවා යි පැතූ සේක.

බුදු රජාණන් වහන්සේද මෙතුමාගෙ ප්‍රාර්ථනාව දිවැසින් බලා මෙයින් කල්ප ලක්‍ෂයක් ගිය කල මාසේම 'ගෞතම' නමින් බුඬත්වයට පත්ව සුවිසි අසංඛ්‍යයක් සත්වයින් නිවන් මගට පමුණුවා සෙසු සියළු සත්වයන්ට මහත් වැඩ කරන්නේය යි එදිනද නියත විවරණ ශ්‍රී ලැබු සේක. එය අසා සිටි අප මහ බෝසතාණන් වහන්සේ සසර පුරුදු පුහුණු වෙමින් එන්නාවූ සමතිස් බෝධි පාරමිතාවන් තව තවත් දියුණු තියුණු කරමින් ලො සතුන් කෙරෙහි මහත් කරුණාවෙන් පෙරුම් දම් පුරමින් භවයෙන් භවයට පැමිසේක.

# සුමේධ සම්බුද්ධ විවරණ කථා

මෙසේ ඒකා සංඛ්‍යය කල්පයක් බුඬ ශූණ්‍යව තිබූ ලොව අඳුර නැසුවාවූ ආලෝකමත් කලාවූ මාරබලය සිඳු වූවා වූ ප්‍රත්‍යක්‍ෂ කරන ලද කර්ම විපාක ඇති ලෝක නායක වූ පියමතුරා බුදු රජාණන් වහන්සෙ පිරිණිවී ශාසන අන්තර්ධානවී තවත් කල්ප හැත්තෑ දහසක් ගෙවී ගිය කල තවත් එක් කල්පයක සුමෙධය, සුජාතය, යන නමින් බුදු රජාණන් වහන්සේලා දෙනමක් ලෝ පහළ වූ සේක.

මෙයින් 'සුමෙධ' නමින් බුදු වූ බෝසතාණන් වහන්සෙ සමතිස් පාරමිතා සපුරා තුසිත ලොව ආයු පමණින් සැප සම්පත් විඳිමින් සිටින අතර ලෝකයට බුදු රජාණන් වහන්සෙ නමකගෙ පහල වීමට සුදුසු කාලය බව දැනගත් දෙව් බඹුන් විසින් එම බෝසතාණන් වහන්සේට මනුලොව බුදුවීමට කාලය බව දන්වා සිටියේ ය. එම ආරාධනාව අනුව ''මා මේසා අති දීර්ඝකාලාන්තරයක් පතාගෙන ඇවිදින් තිබෙන්නෙ මේ සංසාරගත සත්වයින් එම දුකින් මිදවීම සඳහා යි'' කියා සිතා පස් මහ බැලුම් බලා එයට සුදුසු කාලය බව වටහාගෙන 'සුදර්ශන' නම් රාජධානියෙ 'සුදත්ත' නම් රජතුමා නිසා එම රජබිසව කුස පිළිසිඳ දසමාසයක් ගෙවීමෙන් මව් කුසින් බිහිව සත් පියුම් පිට වැඩමවා අභීත සිංහ නාද කර ක්‍රමයෙන් වැඩි යෞවන වයසට පත්ව 'සුමන' නම් කුමරිය සමග නමදහසක් අවුරුදු ගිහිගෙයි සැප සම්පත් විඳ එම දේවීන් වහන්සේ විසින් 'පූර්ණවීසුමිත්‍ර' නම් කුමරු බිහිකල දවස් හි සතර පෙර නිමිති දැක පැවිද්දෙහි කැමතිව මහණව අටමාසයක් මහා වීර්‍ය්‍යය කොට වෙසක් පුර පසලොස්වක් පොහෝ දින නකුල නම් ග්‍රාමයෙහි නකුල නම් සිටු දියණිය විසින් පිළිගන්වන ලද කිරිපිඬු දන් වළඳා සල්වනයෙහි දිවා විහරණයකොට සවස් වේලෙහි 'ශ්‍රී වර්ධණ' නම් ආජීවකයා විසින් පිළිගන්වන ලද තණ අට මිට ගෙන නිපපාදප මූලයෙහි විසි රියන් පමණ වජ්‍රාසනාරූඪව වැඩ හිඳ මාර බලය සුනු විසුණු කොට ප්‍රථම යාමයෙහි සිට අළුයම් යාමය ගෙවා අරුණොදයත් සමග ෂට් අසාධාරණඥාණයන් උපදවමින් සිව්පිළිසිඹියාපත් උතුම් සර්වඥතා බලයට පැමිණ වදාළ සේක.

එකල අප මහ බෝසතාණන් වහන්සෙ 'උත්තර' නම් මානවකව සිටින අතර සර්වඥයන් වහන්සෙ නමක් ලෝ පහළ වූවා යයි දැන මහත් සතුටට පත්ව වහා එම බුදු රජාණන් වහන්සේ කරා එළඹ ධර්මය අසා බලවත් සතුටට පත්ව 'මා සතු වස්තුව බුදු රජාණන් වහන්සෙ වෙනුවෙන් පූජා නොකොට වෙන කුමකට වියදම් කරන්නෙහිද?' යි සිතා මහත් ධනස්කන්දයක් වැය කර බුදු රජාණන්

වහන්සේ ප්‍රමුඛ මහ සඟ රුවණ වෙනුවෙන් දන් දී තුන් සිවුරු පූජාකොට පඤ්චකාම සැප හැර මහණව වෙනත් කිසිම සම්පත්තියක් නොපතා " මා විසින් පිරිනැමුවා වූ දානයේ සහ ආරක්ෂාකර ගත්තා වූ ශීලයෙහි බලයෙන් මම ද මෙම තථාගතයන් වහන්සෙ අවබෝධ කල ශ්‍රී සද්ධර්මය අවබෝධකොට අවබෝධ වේවායි" ප්‍රාර්ථනා කල සේක. එවිට සුමෙධ භාග්‍යවතුන් වහන්සේද මෙම මහා පුරුෂ තෙම පිරිනැමුවාවූ දානයෙහිද ආරක්ෂා කරගත්තා වූ ශීලයෙහිද අනුහසින් මෙයින් තිස්දහසක් කල්ප ගෙවී ගිය පසු 'ගෞතම' නමින් බුදු බවට පත්වන බවට නියත විවරණ ශ්‍රී දී වදාළ සේක.

එවිට අප මහ බෝසතාණන් වහන්සෙ සිතන සේක් දීපංකර බුදු රජාණන් වහන්සේ සතර අසංඛ්‍යය කල්ප ලක්ෂයක් ගිය තැන 'ගෞතම' නමින් සම්මා සම්බුද්ධත්වයට පත්වන්නේය යි දී වදාළ නියත විවරණ ශ්‍රී සතර පැයක් විසි අසුරක් කොට නොසිතා වදාළ සේක් තිස් දහසක් කල්ප වදාළ කල්හි කෙතෙකැයි වදාළ කල්හි තව දීඝියයි සිතන සේක්ද එසේ හෙයින් "මම තිස් දහසක් කල්ප ගෙවී ගිය කල්හි බුද්ධත්වයට පැමිණ මෙම ශ්‍රී සද්ධර්මය පසක් කරමි යි සිතා ශීල සම්පත්තියම වැඩූ සේක.

## සුජාත සම්බුද්ධ විවරණ කථා

මෙසේ සුමේධ බුදු රජාණන් වහන්සේ සියළු සතුන්ට සසර දුකින් මිදීමට උවමනා සියළු බුද්ධකෘතීන් නිමවා 'සුජාත' නමින් ඊ ළඟ අතුරු කල්පයෙහි බුද්ධත්වයට පත්වන්නාවූ බෝසතාණන් වහන්සේට නියත විවර දී වදාලා පිරිණිවන් පා වදාළ සේක. එම බෝසතාණන් වහන්සේද ආයු පමණින් තුසිත දෙව්ලොව දිව්‍ය සම්පත් විඳ දේවතා ආරාධනා අනුව චුතව එකල සුමංගල නම් පුරවරයෙහි සර්වසම්පත් සමුදගතවූ උද්ගත නම් මහරජාණන් වහන්සෙ නිසා 'ප්‍රභාවතී' නම් දේවීන් කුස පිළිසිඳ මවුකුසින් බිහිව සත්පියුම්

පිට වැද ලොව පහළ වන්නාවූ සියළුම බෝසත් උතුමන්ගෙ සිංහ නාදය වූ

**අග්ගො හමස්මි ලොකස්ස**
**ජෙට්ඨො හමස්මි ලොකස්ස**
**සෙට්ඨො හමස්මි ලොකස්ස**
**අයමන්තිමා ජාති නත්ථි දානි පුණබ්බ භවොති**

යන වාක්‍යය වදාළ සේක. ක්‍රමයෙන් වැඩී යෞවන වයස් වූ පසු ශ්‍රී නන්දා නම් දේවීන් වහන්සෙ සමග සරණ මංගල්‍යයට පත්ව දස දහස් අවුරුදු ගිහි සැපත් විඳ 'ශ්‍රී නන්ද නම් දේවීන් කුසින් 'උපසෙන' නම් පුතණුවන් බිහි වූ දවස්හි 'වතංසවෘෂභ' නම් අශ්වරාජයා පිට නැගී මහාභිනිෂ්ක්‍රමණය කොට මහනව නව මාසයක් මහා වීර්‍ය්‍යය කොට වෙසක් මස මැදි දින සුරනන්ද නම් නුවර 'සුරනන්ද නම් සිඨාණන්ගෙ දියණියන් විසින් පිළිගන්වන ලද කිරිපිඬු වළඳා සවස් වේලෙහි සර්වලොක ශොකධුරි භූත කරණ ප්‍රවීන වූ 'වෙණු' බොධිමූලයට එළඹ වජ්‍රාසනයෙහි වැඩහිඳ ලොව පහළ වන්නාවූ සියළුම බුදු රජාණන් වහන්සේලා වෙතම පැමිණෙන මාර සටන සිරිත් පරිදි පරාජය කර පස්මරුන්ද පරාජය කර සිරිත් පරිදිසෑම බෝසතාණන් වහන්සෙ නමක්ම තුන්යාමයේදී ලබා ගන්නා වූ ෂඩ් අසාධාරණ ඥාණය ලබා ගනිමින් අරුණෝදය වේලෙහි සියළුම කෙලෙසුන් නසා බුඬ රාජ්‍යයට පැමිණ වදාළ සේක.

එතැන් පටන් දුගති මාර්ග අසුරමින් සුගති මාර්ග විවෘත කරමින් සත්වයන් සසර බන්ධනයන්ගෙන් මුදවමින් සමස්ත ලොකය බබළවමින් ලොකාර්ථචර්‍ය්‍යායෙහි නියැලී වූ සේක. එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සෙ චක්‍රවර්ථි රජව බුදුරජාණන් වහන්සෙ කරා පැමිණ සඬර්මය අසා බුදු රජාණන් වහන්සෙ කෙරෙහි පැහැදී තම චක්‍රවර්ථි රාජ්‍යය බුදු රජාණන් වහන්සේට පූජාකර එම බුඬ ශාසනයෙහිම පැවිදිව මහණදම් පුරමින් මෙසෙ ප්‍රාර්ථනා කළ සේක.

'' මා විසින් මා සතු චක්‍රවර්ථි රාජ්‍යය භාග්‍යවතුන් වහන්සේට පූජාකර භාග්‍යවතුන් වහන්සෙ වෙත මහණව රැකි ශීල බලයෙන් මේ තථාගතයන් වහන්සෙ අවබොධ කල සර්වඥතා ඥාණය මටද අවබෝධ වේවා ''යි පැතූ සේක. එවිට බුදු රජාණන් වහන්සේද '' මේ මහා පුරුෂ තෙම මේ අසාධාරණ වූ දාන ශීලාදි ගුණයෙහි අනුහසින් මතු 'ගෞතම' නම් සම්‍යක් සම්බුඬ වෙයි කියා පෙර බුදු රජාණන් වහන්සේලා දි වදාළ ශ්‍රී නියක විවරණය දී වදාළ සේක.

මෙසේ අපගෙ සවාමි දරුවන් විසින් චක්‍රවර්ථි රාජ්‍යය පුදා මහණව ප්‍රාර්ථනා කරන ලද්දාවූ උතුම් ශ්‍රී සඬර්මයම ප්‍රාර්ථනා කල යුතුයි සරණ යායුතුයි ගරුකල යුතුයි.

# පියදසසි සම්බුඬ විවරණ කථා

සුජාත බුදු රජාණන් වහන්සේගෙන් පසු නැවතත් කල්ප (28000) විසි අට දහසක් ගෙවෙන තුරු බුඬ කියන වචනයකුදු එතෙක් හටගත් කල්පයන්හි උපන්නාවූ සත්වයින්ටද දිව්‍ය, බ්‍රහ්ම, ලොකොත්පත් සත්වයින්ට ද ඇසීමට තරම් වාසනාවක් නොමැතිව ගෙවී ගියේ ය. මෙසේ එකී කාලය ගෙවී යමින් තිබියදී අප වර්තමාණයෙහි සිටින කල්පයට ඉහත කල්ප (1800) එක්දහස් අටසීයකට පෙර එක් කල්පයෙක 'පියදස්සි' නම් ස්වාමි දරුවො සමස්ත බෝධි පාක්ෂික ධර්ම ප්‍රතිබන්ධ ඇතුව සමත්‍රිංශත් පාරමිතා පූරන ප්‍රවීණතා ඇතුව තුන්වන ආත්ම භාවයෙන් චුතව තුසිත භවනයෙහි ඉපිද එහි ආයු පමණින් වැඩ හිඳ අපමණ දිව්‍ය සැපත් වළඳා පඤ්ච මහා විලෝකනය කොට චුතව ධන්‍ය නම් නුවරෙහි අප්‍රමාණ චිත්ත ඇති 'සුදත්ත' නම් මහ රජාණන් වහන්සෙ නිසා 'චන්ද්‍ර' නම් දේවීන්ගෙ කුසෙහි පිළිසිඳ දසමසක් යවා බිහිව ක්‍රමයෙන් වැඩී නව යෞවනාතරයට පැමිණ 'විමලා' නම් අගමෙහෙසින් වහන්සෙ ප්‍රධානකොට ඇති සුරඟනක් සමාන පුරඟනක් සමග සෑම බෝසත් උතුමන් වහන්සේලාම බුදු බවට පත්වන අවසන් ආත්මභාවයෙහිදි විඳිනා ගිහි සැප මෙම බෝසත් උතුමාද අවුරුදු නවදහස් විඳ විමලා දේවීන් වහන්සේගෙ කුසින් කාඤ්චනසාර නම් පුතණුවන් වහන්සෙ උපන් කල්හි අජාණීය රථයකින් මහාභිණිෂ්ක්‍රමනය කොට පුරුෂයන් ලක්‍ෂයක් සමග මහණව සත් දවසක් මහා වීර්‍ය්‍ය කොට වෙසක් පුන් පොහොදින වෘෂභ බ්‍රාහ්මණයාගෙ දියණිය විසින් පිළිගන්වන ලද්දාවූ කිරිපිඬු වළඳා දිවා විහරණය කොට සවස් වේලෙහි සුජාත නම් ආජීවකයා විසින් දෙන තණ අටමිට පිළිගෙන 'කකුධ' බොධියට එළඹ වජ්‍රාසනාරූඪව මාරබල බිඳ බුඬත්වයට පැමිණ වදාල සේක.

මහා කල්ප 28200ක් තුළ නිවන් මගට සුදුසු දස දහසක් සක්වල සතුන්ට නිවන් දොරටු විවෘත කරමින් ද අනෙකුත් සත්වයන්ට ධර්මාවබෝධය දෙමින්ද සෝවාන් ආදී මාර්ගයන්ට පැමිණීමට මාර්ගය සලසා දෙමින්ද සතර අපා දොරටු අසුරමින්ද එකී නිරයන්හි අනේක දුක් විඳ මනුලොව උපදින සත්වයන් යහමගට පමුණුවමින්ද නැවත නැවත ඔවුන් දුගතිගාමී වීමෙන් වළක්වමින් සුගතිගාමී මාර්ගයන්ට යොමු කරමින්ද තමන් වහන්සේගෙ ශාසනයෙහිදී නිවන් පුරයට යන්නාවූ සත්වයන් වෙනුවට ඊළඟ බුඬ ශාසනය තුලදී නිවන් මගට පිරිසක් එකතු වීමට සලසාදී ඉන්පසු පහළ වන්නාවූ බෝසතාණන් වහන්සේට නියත විවරණ ශ්‍රී දී වැඩ සිටින සේක.

එකල අප මහ බෝසතාණන් වහන්සෙ 'කාශ්‍යප' නම් බ්‍රාහ්මණව එම සර්වඥයන් වහන්සේගෙ ගුණ අසා මහත් සේ ප්‍රසාදයට පත්ව මහත් ධනස්කන්දයක් වියදම් කොට විහාරස්ථානයක් කරවා බුදු පාමොක් මහා සංඝරත්නයට පූජාකර සරණ ශීලයෙහි පිහිටා ''මා විසින් මේ කරගනු ලැබූ කුසල බලයෙන් මෙම සර්වඥයන් වහන්සෙ අවබෝධ කරගත්තාවූ ශ්‍රී සද්ධර්මයම මා හටත් එයාකාරයෙන් අවබෝධ වේවා යි'' පැතූ සේක. බුදු රජාණන් වහන්සේද එතුමාගෙ ප්‍රාර්ථනාව සිතූ පරිද්දෙන්ම ඉෂ්ඨ සිද්ධ වන බැව් දැන වදාරා විවරණ ශ්‍රී දී වදාල සේක.

## අර්ථදර්ශී සම්බුද්ධ විවරණ කථා

මෙසේ පියදස්සී බුදුරජාණන් වහන්සේගෙන් පසු අතුරුකපෙහි 'අර්ථදර්ශී' නමින් බුදු බවට පත්වන බෝසතාණන් වහන්සේද 'ශොබන' නම් නුවරෙහි 'සාගර' නම් මහරජාණන් වහන්සේ නිසා 'සුදශීනා' දේවිය කුසින් බිහිව යෞවන වයස්හිදී 'විශාඛා' මහා දේවීන් වහන්සෙ සමග සරණ මංගල්‍යකර දස දහසක් අවුරුදු ගිහි සැපත් විඳ විශාඛා නම් කල්ප තරු ශාඛා යෙහි ශෛල කුමාර නමැති කුසුම හටගත් කල්හි චතුර්විධ පූර්ව නිමිත්ත දැක පැවිද්දෙහි සුදශීන නම් අශ්වරාජයා පිටින් මහාභිනිෂ්ක්‍රමණය කොට මහණව මාස අටක් මහා වීර්‍යය කොට වෙසක් මස මැදි පොහොය දින සුචින්ද නම් නාග කන්‍යාව විසින් පිලිගන්වනු ලැබූ කිරිපිඬු වළඳා සවස් වේලෙහි 'මහාභී' නම් නාගරාජයා විසින් පිළිගන්වන ලද තණ අටමිට රැගෙන චම්පක මහා බොධියට පැමිණ තමන් වහන්සේගෙ බුඬ මංගල්‍යයට නගාලූ මහා පහන් ටැඹක් බඳු වූ එම බොධිමූලයෙහි පනස්තුන් රියන් වජ්‍රාසනයෙහි වැඩ හිඳ සියළුම බෝසතාණන් වහන්සෙලාගෙ කෘතිය නිමකොට අරුණෝදයත් සමග සම්මා සම්බුඬ රාජ්‍යයට පත්වූ සේක.

එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සෙ චම්පක නම් නුවරෙහි 'සුසීම' නම් බ්‍රාහ්මණ මහා සාරව සර්වලොක සම්මතව පඤ්චකාමයෙහි දොස දැක තමන් වහන්සෙ සතු සියලු වස්තු සම්පත් හැරදමා හිමාල වනයට වැඩ ප්‍රජාවෙන් මහණව වසන සේක තාපසතුමාට බුදුරජාණන් වහන්සෙ ලොපහළ වූ බැව් දැනගන්ට ලැබී බොහෝ සේ සතුටින් බුදු රජාණන් වහන්සේ වෙත පැමිණ මහත් ශ්‍රඬාවෙන් යුතුව ධර්මය අසා එයට සුදුසු පූජාවක් වශයෙන් දෘශ්‍යමාන ශරීරයෙන්ම අහසට නැගී දෙවියන්ගෙ සියක් යොදුන් පරසතු රැක ගලවා සර්වඥයන් වහන්සේගෙ ශ්‍රී පාද මුලයෙහි තබා බුඬපූජා පිණිස දිවමල්

වැසි වස්වා මල් ආසන මවා මහත් ශ්‍රද්ධා භක්තියෙන් යුතුව එම මල් පූජාකර බුදු බවම ප්‍රාර්ථනා කල සේක. එවිට එම බුදු රජාණන් වහන්සේද පෙර බුදු රජාණන් වහන්සේලා සේම විවරණ ශ්‍රී දී වදාළ සේක.

## ධමම දසසී සම්බුද්ධ විවරණ කථා

'අර්ථදර්ශී' බුදු රජාණන් වහන්සේගෙ පිරිණිවීමත් ශාසන අතුරුදහන් වීමත් එම අතුරුකප ගෙවීමත් අවසානයේදී ඊළඟ අතුරුකප 'ධම්මදස්සී' නමින් බුදු බවට පත්වන බෝසතාණන් වහන්සේත් පෙරත් බුදු බවට පත්වන උත්තමයන් වහන්සේලා සේම මනුලොව 'සරණ' නම් මහරජාණන් වහන්සේගෙ අග බිසව බවට පත් සුනන්දා නම් දේවීන් වහන්සේගෙ කුසෙහි පිළිසිඳ දසමස් ඇවෑමෙන් බිහිව ක්‍රමයෙන් වැඩී යෞවන වයස පැමිණි පසු 'විචිකෝළි' නම් මහා පින්වත් කුමරිය සමග විවාහ බන්ධනයට පත්ව අවුරුදු අටදහසක්පෙරත් බුදු බවට පත්වන බෝසතාණන් වහන්සේලා සේම දහස් ගණන් දෙව් ලියන් බඳු සත්‍රී සම්පත් විඳිමින් සිට විචිකෝලි නම් දේවීන් වහන්සේගෙ කුසින් 'පුණ්‍යවඩ්න නම් කුමාරයන් වහන්සෙ උපන් කල්හි සතර පෙර නිමිති දක පැවිද්දෙහි කැමතිව අහසට පැන නැග්ගාවූ සුදර්ශන නම් ප්‍රාසාදයෙන්ම මහා භිනිෂ්ක්‍රමණය කොට මහණව සත් දවසක් මහා වීර්‍ය්‍යය කොට 'විචිකෝළි' නම් දේවීන් වහන්සෙ විසින් පිළිගන්වන ලද කිරිපිඩු වළඳා 'බදර' වනයෙහි දවස් යවා ශ්‍රීවඩ්ණ නම් යවපාලකයා විසින් දෙන ලද තණ අට මිට පිළිගෙන 'රක්තකුරවක' බොධියට එළඹ පනස්තුන්රියන් උස වජ්‍රාසනයෙහි වැඩ හිඳ පෙර බෝසතාණන් වහන්සේලාසේම පසුදා අරුණෝදයත් සමග සියළු කෙලෙසුන් බිඳ දමා උතුම් වූ සර්වඥතා ඵලයට පැමිණ වදාළ සේක.

එකල අප මහ බෝසතාණන් වහන්සෙ ශක්‍ර දේවේන්ද්‍රව බුදු රජාණන් වහන්සෙ කෙරෙහි මහත් පැහැදීමෙන් යුතුව දිව්‍ය සේනාව රැස්කරවා නානා ප්‍රකාර වූ පූජා විශෙෂ සපයා බුදු රජාණන් වහන්සෙ කරා පැමිණ දිව්‍ය පුෂ්ප, ධූප, දීප, නෘත්‍ය, ගීත වාද්‍යාදීන් මහා පූජා පවත්වා බුදු සරණ ගොසින් තමන් වහන්සෙ කල අනුපම බුඬ පූජාවෙහි හා පිහිටියාවූ සරණයෙහි අනුහසින් මටද මේ බුදු රජාණන් වහන්සෙ අවබෝධ කරගත්තාවූ සඬර්මයම අවබෝධ වේවායි'' පැතූ සේක. බුදුරජාණන් වහන්සේද එය එසේම සිද්ධවන බැව් දක විවරණ ශ්‍රී දී වදාල සේක.

# සිද්ධාර්ථ සම්බුද්ධ විවරණ කථා

මෙසෙ ලොසතුන්ට සසර සාගරයෙන් එතෙර වීමට තිබූ නෞකාවක් බඳුවූ ධර්මදර්ශී නම් සම්බුදු රජාණන් වහන්සෙ පිරිනිවී කල්හි එම බුදු රජාණන් වහන්සේගෙ ශාසනයද ක්‍රමයෙන් අන්තරහිත වූ කල්හි එම කල්පයද විනාශයට පත්වූ කල්හි එතැන් පටන් කල්ප 1706 ක් ගිය කල්හි මෙකපට 94 කල්පයකින් මත්තෙහි එක් කල්පයක්හි ඒකවීර වූ ඒකධීර වූ එකමාන්‍ය වූ ඒක වීර පුරුෂොත්තම වූ බොසත් උතුමෙක් සමතිස් පෙරුම් දම් පුරා තුසිත පුරයෙහි ඉපිද ආයු පමණින් දිව්‍ය සම්පත් විඳිමින් සිටිනාතර දිව්‍ය සේනාව එක් රැස්වී පෙර බොසත් උතුමන්ට ආමන්ත්‍රණය කරන ආකාරයට මෙතුමාටද මෙසේ ආමන්ත්‍රණය කළේය.

'පින්වත් නිදුකාණන් වහන්ස, ඔබ වහන්සෙ මෙසේ දිව්‍ය සම්පත් විඳිමින් සිටින්නේ අන් කරුණක් නිසා නොව අති දීර්ඝ කාලාන්තරයක් සමතිස් පාරමී ධර්මයන් සපුරා තිබෙන්නෙ සියළුම ලෝසතුන් කෙරෙහි කරුණා මෛත්‍රී සිතින් සත්වයන් සසර දුක් බන්ධනයෙන් මුදවා නිවන් පුරට යැවීම සඳහායි දැන් බුදු වීමට කාලය පැමිණ තිබේ. එම නිසා දැන් සුදුසු කාලයයි එය ඉවසා වදාරණ සේක්වායි එකහඬින් දෙවියන් අයැද සිටියේ ය. එවිට උත්තමයාණන් වහන්සෙ පස් මහ බැළුම් බලා සුදුසු කාලය බව දැන දෙවියන්ට තම තමන්ගෙ විමාන වලට යාමට අවසර දී තුසිත පුරෙන් චුත වී වෛභාවන නම් නුවරෙහි 'උදයන' නම් මහ රජාණන් නිසා 'සුසපාශී' නම් රජ බිසවගෙ කුසෙහි පිළිසිඳ දසමස් ඇවෑමෙන් මවු කුසින් බිහිව ක්‍රමයෙන් වැඩී නව යොවුන් වයසට පත්ව එසා පින් ඇති 'සෞමනස්‍ය' දේවීන් වහන්සෙ සමග සරණ මඞ්ගල්‍යයට පත්ව ගිහි සැප විඳ එම දේවීන් වහන්සෙ කුසින් 'අනුපම' නම් කුමාරයන්වහන්සෙ බිහිවූ දවස්හි සවර්ණ ශිවිකායෙන් මහාභිනිෂ්ක්‍රමය කොට මහණව දස මාසයක් මහා වීර්යය කොට 'අසදෘශ' නම් බ්‍රාහ්මණ ගාමයෙහි 'සුනෙත්‍රා' නම් බ්‍රාහ්මණ කන්‍යාව විසින් පිළිගන්වන ලද කිරිපිඬු වළඳා සවස් වේලෙහි 'වරුණ' නම් යවපාලයා විසින් දෙන ලද තණ අට මිට රැගෙන 'කර්ණිකාර' බෝධිමූලයෙහි අතුරා වජ්‍රාසනාරූඪව දසමරුන්, පඤ්චමාරයන් පරදා පෙර බුදු රජාණන් වහන්සේලා සේම සත් සති යවා දම්සක් පවත්වා පෙර බුදු රජාණන් වහන්සේලා අනුගමනය කල බුද්ධ ක්‍රියාවන්හි යෙදී වදාළ සේක.

එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සේ 'සූරසේන' නම් නුවර ''මඞ්ගල'' නම් බ්‍රාහ්මණව කාමයෙහි ආදීනව දැක තාපස ප්‍රව්‍රජාවෙන් මහණව

පසේවා බිඳා අෂ්ඨ සමාපත්ති උපදවා වසන කල 'සිඩාර්ථ' නමින් බුදු රජාණන් වහන්සෙ නමක් ලො පහළ වූ බව දැන බුදු රජාණන් වහන්සෙ වෙත පැමිණ ධර්මය අසා පෙර පුරුද්දට මහත් සේ පැහැදී දඹදිවට මායිම් වූ මහ දඹ ගසට නැග ඵල නෙලාගෙන වුත් බුදු රජාණන් වහන්සෙ ප්‍රධාන අනු කෙළක් භික්ෂූන් වහන්සේලාට මිහිරි රස දඹ අනුභව කරවා ''මම කරන ලද මෙම පූජාවෙන් බුදු රජාණන් වහන්සේට සේම මටද ශ්‍රී සඬර්මයම අවබෝධ වේවා''යි පැතීය. එවිට බුදු රජාණන් වහන්සේද දීපංකර බුදු රජාණන් වහන්සේ පටන් ලෝ පහළ වූ සැම බුදු රජාණන් වහන්සේලා සේම විවරණ ශ්‍රී දී වදාළ සේක.

## තිසස සම්බුද්ධ විවරණ කථා

මෙසේ එම බුදු රජාණන් වහන්සේගෙ ශාසනයද එම කල්පය ද අවසන් වූ කල්හි මධ්‍යයෙහි එක් කල්පයක් බුඬ ශූන්‍ය විය. ඉන් පසු කල්පයෙහි බුදු රජාණන් වහන්සේලා දෙනමක් ලො පහළ විය. මෙයින් පළමුව තිස්ස බුදු රජාණන් වහන්සේ මෙසේ බුඬ රාජ්‍යයට පැමිණ වදාළ සේක. තුසිත දෙව්ලොවින් චුතව ' සත්‍ය සන්ධ' නම් රජතුමාගෙ අගබිසව වූ 'පද්මා' නම් දේවිය කුස පිළිසිඳ මවුකුසින් බිහිව ක්‍රමයෙන් වැඩී යෞවන වයසට පැමිණ 'සුභද්‍ර' නම් දේවීන් වහන්සෙ සමග සරණ මංගල්‍යයට පැමිණ අවුරුදු හත්දහසක් ගිහි සැප විඳ එම දේවීන් වහන්සෙගේ කුසින් 'ආනන්ද' කුමාර' යන් වහන්සෙ බිහිවූ දවස්හි 'සොනොත්තර' නම් අශ්වරාජයා පිට නැගී මහාභිනිෂ්ක්‍රමණය කොට පැවිදිව අටමසක් මහා වීර්‍යකොට වීර නම් ග්‍රාමයෙහි වීර නම් සියාණන්ගෙ දියණිය විසින් පිළිගන්වනු ලැබූ කිරිපිඬු වළඳා සරල වනයෙහි දිවා විහාර කොට සවස් වේලෙහි විජිත සඞ්ග්‍රාම නම් යවපාලයා විසින් දෙන ලද තණ අට මිට ගෙන 'අසන' බෝධිමූලයට එළඹ වජ්‍රාසනයෙහි වැඩ හිඳ මාර පරාජය කර සව්කෙලෙසුන් නසා බුඬත්වයට පත්ව සිටින අතර

අප මහ බෝසතාණන් වහන්සේ ද ''යසවතී'' නම් රාජධානියෙහි 'සුජාත' නම් මහරජව පඤ්චකාමයෙහි ආදීනව දැක සියළු සම්පත්තියෙන් පිරුණ රාජ්‍යය හැර මහණව වනයෙහි හැසිරෙන කල තිස්ස නමින් බුදු රජාණන් වහන්සේ නමක් ලෝ පහල වී සිටින බව දැන මහත් චිත්තප්‍රීතියට පත්ව තව්තිසා භවනට ගොස් දිව්‍ය උයන් සතරට වැද පරසතු මල්ද මදාරා මල්ද ගෙන මහපියුම් සතක් සාදා බුදු රජාණන් වහන්සේගෙ සිරසට මුතු කුඩයක් සේ සාදා අල්වා සිටි සේක. එසෙ සෙවන සාදමින් සිටිමින්ම ''මෙම කුසල බලයෙන්ම මට වෙනත් සම්පත්තියක් නොව බුදු රජාණන් වහන්සේට මෙන්ම

මටද සර්වඥතාවයම ලැබේවා''යි පැතූ සේක. බුදු රජාණන් වහන්සේද අප මහ බෝසතාණන් වහන්සේගෙ ප්‍රාර්ථනාව දැක එය එසේම ඉටුවන බැව් දැක විවරණ ශ්‍රී දී වදාළ සේක.

## පුසස සම්බුද්ධ විවරණ කථා

මෙසේ බුදු රජාණන් වහන්සේ පිරිනිවී බුඬාන්තරයක්ගෙවී ගිය පසු ඊළඟ බුඬත්වයට පත්වන උත්තමයා තුසීපුරයෙන් චුතව කසී නම් නුවරෙහි 'ජයසේන' නම් රජතුමාණන් වහන්සෙ නිසා 'ශ්‍රීමතී' නම් දේවීන් කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් මවුකුසින් බිහිව වැඩී යෞවන වයසට පැමිණ 'කිසාගෝතමීන්' දේවීන් වහන්සෙ ප්‍රධාන සුරඟනන් බඳු වරඟනන් සමග දසදහසක් අවුරුදු ගිහි සැප විඳ සතර පෙර නිමිති දැක පඤ්චකාමයෙහි ආදීනව දැක කලකිරී අගබිසව වූ කිසාගෝතමීන් වහන්සෙගෙ කුසින් 'අනුපම' නම් පුත්‍ර රත්නය ලත් දිනදී හස්තියානයෙන් මහාභිනිෂ්ක්‍රමණය කොට මහනව හයමසක් මයා වීයර්ය කොට වෙසක්පුර පසලොස්වක් දින 'ශ්‍රී වඬීන' නම් සිටු දියණිය විසින් පිළිගන්වනු ලැබූ කිරිපිඬු වළඳා සවස් වේලෙහි බොධිමූලයට පැමිණ තිස්අටරියන් වජ්‍රාසනයෙහි වැඩ හිඳ පසුදා අරුණෝදයත් සමග සියළුම කෙලෙස් සිඳ බිඳ දමා සම්මා සම්බුඬත්වයට පත්වූ සේක.

මා විසින් ත්‍රිවිධ රත්නය වෙනුවෙන් මේසා මහත් දන්දී රජකම හැර පැවිදිව රකිනා සීල සම්පත්ති ගුණ බලයෙන් බුදු රජාණන් වහන්සේට මෙන්ම මා හටද සර්වඥතා ඥාණය පහළ වේවායි පැතූ සේක. බුදු රජාණන් වහන්සේද එය ඉටුවන බව දැක විවරණ ශ්‍රී දී වදාළ සේක.

## විපස්සි සම්බුඬ විවර කථා

මෙසේ 'පුස්ස' බුදු රජාණන් වහන්සේද ශාසනයද එම කල්පයද ගෙවී අවසන් වී මෙයට කල්ප අනූ එකකට ප්‍රථම කල්පයේදී විපස්සි නම් බුදු රජාණන් වහන්සේගෙ ලෝ පහළ වීම මේසේ සිදූ විය.

එනම් පස්මහ බැලුම් බලා බුදු වීමට සුදුසු කාලය බව දැන තුසිත දෙව්ලොවින් චුතව බන්දුමති නම් නුවර 'බන්දුමති' නම් මහරජාණන් වහන්සෙ නිසා බන්දුමතී නම් දේවීන් වහන්සේගෙ කුස පිළිසිඳ බිහිව ක්‍රමයෙන් ඇති දැඩි

වී යෞවන වයසට පත්ව 'සුදර්ශනා' නම් මහා දේවීන් වහන්සෙ අගමෙහෙසිය සමග අවුරුදු අටදහසක් ගිහි සැප විඳ චතුවිධ පූර්ව නිමිති දැක සුදර්ශනා දේවීන් කුසින් 'සමවෘත්තස්කන්ධ' නම් පුත්‍ර රත්නය බිහි වූ කල්හි අජානීය සෙන්ධවයින් යෙදූ රථයෙන් මහාභිනිෂ්ක්‍රමණය කොට මහනව අටමස් වීර්‍ය්‍යකොට 'සුදර්ශන' නම් සිටාණන්ගෙ දියණිය විසින් පිළිගන්වන ලද කිරිපිඬු වළඳා සල්වනෙහි දිවා විහරණය කොට සවස් වේලෙහි 'සුජාත' නම් යවපාලයා විසින් පිරිනමණ ලද තණ අටමිට පිළිගෙන 'පාටලි' බොධියට වැඩ වජ්‍රාසනාරූඪව පෙර බෝසතාණන් වහන්සේලා සේම දසමාර පඤ්චමාර බල බිඳ සියළුම කෙලෙස් නසා අරුණොදයත් සමග සම්මා සම්බුඬරාජ්‍යයට පත්වූ සේක.

එසමයෙහි අපගෙ බෝධිසත්වයන් වහන්සෙ නාග ලෝකයෙහි මහානුභාව සම්පන්න නාගරාජව ඉපිද නාග සේනාවන් පිරිවරාගෙන තථාගතයන් වහන්සෙ කරා එළඹ බුදුපාමොක් මහ සඟරුවනට වැඩ සිටීමට සුදුසු මණ්ඩපයක් මවා එහි සපිරිවර සමග බුදු රජාණන් වහන්සෙ වඩා හිඳුවා සත්දවසක් දන් පිළිගන්වා අවසානයෙහි බුදු රජාණන් වහන්සේට වැඩ සිටීමට උතුම් ආසනයක් මවාදී බුදුබවම ප්‍රාර්ථනා කළ සේක.

මේසේ අපගෙ ගෞතම ගොත්‍රයෙහි උපන් බෝසතාණන් වහන්සෙ විසින් මනුෂ්‍යවද, දෙවේන්ද්‍රවද, සිංහරාජවද, චක්‍රවර්ති රජවද, නාගරාජවද, නොයෙක් ලෙසින් කුසල් කොට පතන ලද්දාවූ ශ්‍රී සඬර්මයම සරණ යමි. දහම් සරණ යායුතු සිතට ගතයුතු.

## සිඛී සම්බුද්ධ විවරණ කථා

මෙසේ එම බුදු රජාණන් වහන්සෙ පිරිනිවී ශාසනයද අතුරුදහන් වී එම කල්පයද විනාශවී ගිය පසු කල්ප හැට එකක්ම බුඩ කියන වචන මාත්‍රයකුදු ඇසීමට නැතිව මිථ්‍යාදෘෂ්ඨි ග්‍රහනයට පත්ව තිබියදී මෙයින් එකුන් තිස් කල්පයකින් මත්තෙහි 'සිඛී' නම් බුදු රජාණන් වහන්සෙ නමක් සහ 'වෙස්සභූ' නමින් බුදු රජාණන් වහන්සේලා දෙනමක් ලෝ පහළ විය.

එයින් සිඛී බුදු රජාණන් වහන්සේගෙ විස්තර මෙසේයි - එම මහ බෝසතාණන් වහන්සෙ 'අරුණවතී' නම් රාජධානියෙහි 'අරුණවත්' මහ රජාණන් වහන්සෙ නිසා ප්‍රභාවතීන් වහන්සේගෙ කුසෙහි පිළිසිඳ දසමස්

ඇවෑමෙන් බිහිව සත්පියුම් පිට වැඩ සිංහනාද කර ක්‍රමයෙන් වැඩී යෞවන වයසට පත්වූ කල්හි 'සබ්කාමි' නම් දේවීන් වහන්සෙ සමග සත් දහසක් අවුරුදු ගිහි සැපත් විඳ දේවීන් වහන්සේගේ කුසින් 'අතුල' නම් පුතණුවන් වහන්සෙ උපන් කල්හි ගිහි ගෙයි පඤ්චකාම සැපයන්හි විපාක දැක පැවිදි වනු කැමතිව හස්ති වාහනයෙන් මහා භිනිෂ්ක්‍රමණය කොට අටමසක් මහා වීර්‍ය්‍යය කොට සුදර්ශණ නම් ගම 'ප්‍රියදර්ශණ' නම් මහා සිඨාණන්ගෙ දියණියන් විසින් පිළිගන්වන ලද කිරිපිඩු වළඳා ඛදිර වනයෙහි දිවා විහරණය කොට සවස්වේලෙහි 'අනවදර්ශී' නම් තාපසයන් විසින් පිළිගන්වන ලද තණ අටමිට ගෙන 'පුණ්ඩරීක' බෝධිය වෙත පැමිණ විසිහතර රියන් වජ්‍රාසනයෙහි වැඩ හිඳ මාර බල බිඳ ෂඩ් අසාධාරණ ඥාණයන් ලබා අළුයම් වේලෙහි බුඬ රාජයයට පැමිණ වදාළ සේක.

එසමයෙහි අප බෝසතාණන් වහන්සේ 'අපරිභූත' නම් නුවර 'අරින්දම' නම් රජව රාජ්‍යය කරන සමයෙහි එතුමාගෙ රාජධානියට බුදු රජාණන් වහන්සෙ ප්‍රමුඛ මහා සංඝයා වහන්සෙ වැඩිය බැව් අසා සතුටට පත්ව පෙර ගමන් ගොස් බණ අසා අතිශයින් සතුටට පත්ව සත් දවසක් මුළුල්ලෙහි දන්දී තුන් සිවුරු පූජාකර තම මගුල් ඇතා උසක තබා එපමණ උසට බෙහෙත් ඖෂධ පූජාකර දුන් සේක. එම අවස්ථාවේදීත් අන්කිසිවක් නොව බුදු බවම ප්‍රාර්ථනා කල සේක. සිඛී බුදු රජාණන් වහන්සේද එය සිඬවන බව දැක විවරණ ශ්‍රී දුන් සේක.

මෙසේ අප මහ බෝසත් තුමාණන් වහන්සේ සුමෙධ තාපස ආත්ම භාවයෙ පටන් අරින්දම රජව උපන් ආත්මය දක්වා බුඩොත්පාදයෙහිද බුදු රජාණන් වහන්සේලා හමුවෙහිද අබුඩොත්පාද කාලයෙහිද බොධිසත්වාභිප්‍රාය වූ පරිද්දෙන් දානාදි නොයෙක් පිංකම් කොට පතන ලද්දාවූ සඬම්යම සරණ යෙම් දහම් සරණ යායුතු.

## වෙස්සභූ සම්බුද්ධ විවරණ කථා

මෙසේ සිඛී බුදු රජාණන් වහන්සේගෙ ශාසන අවසානයෙ එම බුඬාන්තරය ඉක්මුණු කල්හි ඊළඟ අතුරුකප 'වෙස්සභූ' බුදු රජාණන් වහන්සෙ පහල විය. ඒ කෙසේද ? යත් - චාරිත්‍රානුකූලව පැවත එන්නාවූ තුසිත දෙව්ලොවින් චුතව 'අනුපම' නම් නුවර 'සුප්‍රනීත' නම් මහ රජතුමාණන් නිසා 'ශීලවතී' නම් දේවීන් වහන්සේගෙ කුසෙහි පිළිසිඳ බිහිව යොවුන් වයසට ' නම්

පැමිණි කල්හි 'සුමිත්‍රා' නම් පින්වත් දේවීන් වහන්සෙ සමගින් අවුරුදු දස දහසක් ගිහි සැප විඳ එම දේවීන් වහන්සෙ 'සුප්‍රබුඬ ' නම් පුත්‍රුවන උපන් කල්හි සතර පෙර නිමිති දක රන්සිවි ගෙයින් මහාභිනිෂ්ක්‍රමණය කොට පැවිදිව මාසයක් මහා වීයර්‍ය කොට සුචිත්‍රා නම් ගම 'ශ්‍රී වර්‍ධන' නම් නාගකන්‍යාව විසින් පිළිගන්වනු ලැබූ කිරිපිඬු වළඳා සල්වනෙහි දිවා විහාරකොට සවස් වේලෙහි 'නරෙන්ද්‍ර' නම් නාගරාජයා විසින් පූජාකරන ලද තණ අටමිට පිළිගෙන ශාල බෝධියට පැමිණ වජ්‍රාසනයෙහි වැඩ සිට පසුදා අරුණෝදයත් සමග සියළු කෙලෙසුන් නසා බුඬ රාජ්‍යයට පත්වූ සේක.

එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සේ තමන් වහන්සෙ විසූ 'සරණවතී' නම් නුවරෙහි 'සුදර්‍ශණ' නම් මහරජව ගම් නියම් ගම්හි චාරිකාවෙහි යෙදෙන්නාවූ භාග්‍යවතුන් වහන්සෙ තමන් වහන්සෙගේ නුවරට වැඩිය කල්හි පෙර ගමන් කොට පිළිගෙන බණ අසා හට ගත්තාවූ බුඬාලම්බන ප්‍රීතියෙන් යුතුව දන්දී තුන් සිවුරු පූජාකර බුදු රජාණන් වහන්සේට විශේෂ කුටියක් කරවා ඒ වටා තවත් විහාර දහසක් කරවා පූජාකර අවසානයෙහි සියළු රාජ සම්පත් හැර පැවිදිව සියළු සම්පත් සඟසතු කොට කෙලෙස් ධුතාංගධරව මහාගුණ පූරා බුදු බවම පැතූ සේක. වෙස්සභූ බුදු රජාණන් වහන්සේද නියත විවරණ ශ්‍රී දී වදාළ සේක.

## කකුසඳ සම්බුද්ධ විවරණ කථා

'වෙස්සභූ' බුදු රජාණන් වහන්සේගෙ ශාසනයද එම කල්පයද විනාශවී කල්ප තිස් එකක් අබුඩොත්පාදව අන්ධකාරව ගෙවී ගිය පසු අපසේ වුවන්ගෙ තුඩද තුණුරුවන්හි නම්වකාපියන්ට (නො) පොහොසත් වූ දෙව්දත්තහු වැනි රත්නත්‍රයට ද්‍රොහීන් පවා 'බුදු සරණ යමි' කී බසක් පමණකින් මතු පසෙ බුදු නිවන් දක්නට හේතු සම්පත් ලබන්නට සුදුසු වූ පස්වා දහසක් මුළුල්ලෙහි මාගෙ ස්වාමි දරුවන්ගෙ පියවර එබූ සමතල ගල වැන්දහ. කැළණිය වැන්දහ යනාදි වූ සුචරිත කලවුන් මාගෙම සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ නිවනට ගෙනයාමට පොහොසත් වූ මාගෙ ස්වාමි දරුවන් හිඳ බුදු බවට පත්වූ බෝ රුක්හි පරම්පරාවෙන් පැවත එන්නාවූ රුක්හි පවා මළ පරඬලා ගෙන පූජාකල වුන් පවා සජීව බුදු රජාණන් වහන්සේට පූජාකලවුන් ලබන දිව්‍ය සම්පත්ති මනුෂ්‍ය සම්පත්ති වළඳන්නාවූ ස්වාමි දරුවන් නොහැඳින වන්නාවූ අප පොවා ඒ තුණුරුවන්හි සරණින් ගිනි - ගිනි යයි නොසිතා විෂ - විෂ යයි නොසිතා චන්ඩවූ සිංහ ව්‍යාඝ්‍රාදීන් චන්ඩ සත්ව යෙකු යැයි නොසිතා අවිවේකී වූ ප්‍රචණ්ඩ

වූ පරලොවක් ඇතැයි නොසිතන ජීවිතය අස්ථිර යයි නොසිතන මත්පැන් බී මත් ආරෝහකයන් නැගී මතැතුන් සේ කී කීවක් කී කීවක්ම කරන භයංකරවූ රාජකුලයට වැද අප තුණුරුවන් ගැත්තන්ට කුමන නම් උපද්‍රවයක් වේදැයි යෙහෙන් නිදා පිබිද අකාල මරණින් ගැලවෙන පමණ සුචරිත පුරන්නට සුදුසු වූ බදු රජාණන් වහන්සේ මරම්හයි දිවූ අංගුලිමාලයන් දෙසූ පිරිතෙන් පොවා කල්පයක් පුරා ලෝක ශාන්ති දෙන්නාවූ බුදු රජාණන් වහන්සේගෙ පාදයෙන් අල්වා පරසක්වල ගසම්හයි කිවු ආලවකයා පවා තමන් වළඳන පය ගත් අනඳ මහතෙරුන් වහන්සෙලාද ගුණ ධර්මයෙහිම පිහිටුවන උතුමන් ඇති වීමෙන් ලොවට අසහාය සරණ වූ බුදු රජාණන් වහන්සෙ මැරීමට දිව් නාලාගිරි නම් මත් ඇතුන් පවා ධනපාලය සීලපාලය යන නම් කියවූ බුදු රජ මුහුණ බලාහුන් බකමුහුණක්හු පවා පසෙබුදු වන්නට හේතු සම්පත් ලබන්නාසේ බුදු රජාණන් වහන්සේගෙ ධාතු පිහිට වූ සතර රියන් දාගැබ් බැඳවූ අපසෙ වූවන් පවා නිවනට පමුණුවන්නාවූ තුණුරුවන් පිහිටි මෙම ලක්දිව පස්ගෙන මුහුනෙන් පිදුවනුදු බුදු රජාණන් වහන්සේගෙ ශ්‍රී පාදය මුදුනෙන් පිදුවන් ලබන අමා මහ නිවන් බලන්නට කාරනාව සිටියාවූ සකල ගුණ හදුවූ මෙම භද්‍ර කල්පයෙහි

නසන ලද භව ප්‍රතිසන්ධි ඇති 'කකුසඳ' නම් එක් සර්වඥයන් වහන්සෙ නමක්ද ලොකප්‍රමාණ ගුණ ගමන ඇති 'කොනාගමන' නම් සර්වඥයන් වහන්සෙ නමක්ද ශ්‍රමණ ගුණ සම්පන්න වූ 'කාශ්‍යප' නම් සර්වඥයන් වහන්සෙ නමක්ද එසේම සසර දුක් විඳින්නවුන්ට ක්ෂෙමභූමියක් වූ පන්දහසක් අවුරුදු මුළුල්ලෙහි තමන් නම කීවන්ට වැඳ පිදුවන්ට පවා තමන් ලද තනතුරු දෙන සකල පුරුෂොත්තම වූ හුදෙක් මා නිසාම සසරට වන් මා සේ වූ අඥානයෙකුගෙ ලයට පවා මිහිරි බව වැටහෙන පරිද්දෙන් ඉතා ආශ්චර්‍ය්‍ය වූ ගුණ ඇති 'ගෞතම' නම් ස්වාමි දරුවො එක්කෙනෙකැයි මෙසේ සතර දෙනෙකුන් වහන්සෙ සමමා සම්බුඩ රාජ්‍යයට පත්වූ සේක. සකල ලෝක කල්‍යාන මිත්‍ර වූ 'මෛත්‍රිය' නාතයන් වහන්සෙ මතු බුදු වන්නට දවස් යවමින් දෑන් තුසිත දෙව් ලොව වැඩ සිටින සේක.

## කකුසඳ සම්බුඬ විවරණ කථා

මෙම බෝසත් උතුමා තුසීපුරයෙන් චුතව 'ක්ෂෙමවතී' නම් රාජධානියෙහි 'ක්‍ෂම' නම් මහරජාණන්ට පුරෝහිත වූ 'අග්නිදත්ත' නම් මහා බ්‍රාහ්මණයානන් වහන්සෙ නිසා සර්වඥ පුත්‍රලාබයෙන් විශොක වූ 'විශාකා' නම් බැමිණියන් වහන්සෙගෙ කුසෙහි පිළිසිඳ මවුකුසින් බිහිව යෞවන වයසට

පත්ව 'රොචිනි' නම් බ්‍රාහ්මණීන් වහන්සෙ ප්‍රධාන තිස්දහසක් පුර ස්ත්‍රීන් සමග හාරදහසක් අවුරුදු ගිහිසැප විඳිමින් සිටින අතර සතර පෙර නිමිති දැක 'රොචිනි' බ්‍රාහ්මන කුමරින් වහන්සෙ 'උත්තර' නම් කුමරු බිහිකල දින අජාණීය සෛන්ධවයන් යෙදූ රථයෙන් මහාභිනිෂ්ක්‍රමණය කොට හතලිස් දහසක් පුරුෂයන් සමග මහණව අටමසක් වීර්‍ය්‍යය කොට වෙසක් පුර පසළොස්වක් දින 'සුචින්දර' නම් ගම්හි වජේන්ද්‍ර නම් බ්‍රාහ්මණයන්ගෙ දියණියන් විසින් පිළිගන්වනු ලැබූ කිරිපිඩු වළඳා කිහිරි වනයෙහි දිවා විහාර කොට සුභද්‍ර නම් යවපාලයා විසින් දෙන ලද තණ අටමිට පිළිගෙන 'මහරි' බොරුක්මුල එලා වජ්‍රාසනයෙහි වැඩ හිඳ පසුදා අළුයම බුද්ධ රාජ්‍යයට පත්වූ සේක.

එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සෙ 'ක්ෂෙම' නම් මහරජව බුදු පාමොක් මහ සඟරුවනට සර්ව පරිෂ්කාර දන්දී රාජ්‍යය හැර බුදු සසුනෙහි මහණව බුදු බවම පැතූ සේක.

## කෝණාගමන සම්බුද්ධ විවරණ කථා

මෙසේ කකුසඳ බුදු රජාණන් වහන්සෙ සත්ව කරුණාවෙන් ලොකාර්ථකොට බුඬ කෘත්‍යය නිමවා පිරිණිවන් පෑ පසු දෙවන අතුරුකප 'කොනාගමන' බුදුරජාණන් වහන්සෙගෙ ශාසනය උදා විය. ඒ කෙසේද යත් - 'ශොභාවති' නම් රාජධානියෙහි 'යඥදත්ත' නම් බ්‍රාහ්මණයානන් වහන්සෙ නිසා උත්තරා නම් බ්‍රාහ්මණීන් වහන්සෙගෙ කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් බිහිව තරුණ වයසට පත්ව 'රුචිග්‍රාතා' නම් බ්‍රාහ්මණීන් වහන්සෙ සමග සරණ මඬගල්‍යයට පැමිණ තුන්දහසක් අවුරුදු යවා රුචිගාත්‍රා නම් බ්‍රාහ්මණීන් වහන්සෙගෙ කුසින් 'සතවාහ' පුත්රුවන උපන් කල්හි හස්ති වාහනයෙන් මහාභිනිෂ්ක්‍රමණය කොට මාස හයක් වීර්‍ය්‍යය කොට වෙසක් මැදි පොහෝ දින 'අගතිසේන' නම් බ්‍රාහ්මණයාගෙ දියණිය විසින් පිළිගන්වන ලද කිරිපිඩු වළඳා තිඹිරි වනෙහි දිවා විහාරකොට සවස් වේලෙහි 'තින්දුක' නම් යවපාලයා දෙන ලද තණ අටමිට ගෙන 'උදුම්බරා' බෝධියට එළඹ විසිරියන් වජ්‍රාසනයෙහි වැඩ සිටි සියළු කෙලෙස් සතුරන් ජයගෙන අරුණොදයේ බුඬ රාජ්‍යයට පත්වූ සේක.

එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සෙ මිථිලා නම් නුවර සියලු සම්පත්වලින් පරිපූණිව පර්වත නම් රජව බුදුපාමොක් මහා සඟරුවනට තුන්මාසයක් පුරා මහා දන් දී තුන් සිවුරු පූජාකර බුදු බවම පැතූ සේක. එවිට

බුදු රජාණන් වහන්සෙ දිවැසින් බලා මෙම කල්පයෙහිම බුදුවන බවට විවරණ ශ්‍රී දුන් සේක.

## කාශ්‍යප සම්බුද්ධ විවරණ කථා

මෙසේ කොනාගමන බුදු රජාණන් වහන්සෙගෙ පිරිණිවීමත් ශාසන අන්තර්ධානවීමත් සිදුවී තුන්වන අතුරුකප කාශ්‍යප බුදු රජාණන් වහන්සේගෙ පහළ වීම මෙසේ සිදු විය.

බාරානසී නම් රාජධානියෙහි 'බ්‍රහ්මදත්ත' නම් බ්‍රාහ්මණයානන් වහන්සෙ නිසා 'ධනවතී' නම් බ්‍රාහ්මණීන් වහන්සේගෙ කුසෙහි පිළිසිඳ දසමස් ඇවෑමෙන් බිහිව ක්‍රමයෙන් වැඩි වයසට පැමිණ 'සුනන්ද්‍ර' නම් බ්‍රාහ්මණීන් වහන්සෙ ප්‍රධාන පුරඟනන් සමග දෙව්සැප හා සමාන ගිහිසැපත් විඳිමින් අවුරුදු දෙදහසක් ගෙවා 'විජිතසේන' නම් පුත්‍ර රත්නය ලත්දින ගිහි ගෙයි කලකිරී වැඩ සිටි ප්‍රාසාදයෙන්ම මහා භිනිෂ්ක්‍රමණය කොට තමන් වහන්සෙ සමග ප්‍රාසාදයෙන් පැමිණි කාන්තාවන් ආපසු යවා සෙසු පිරිස සමග මහණව හත්දවසක් මහා වීර්‍ය්‍යය කොට වෙසක් මැදි පොහෝ දින 'සුනන්ද්‍ර' නම් බැමිණිය විසින් පිළිගන්වන ලද්දාවූ කිරිපිඬු වළඳා බදිර වනයෙහි දිවා විහරණයකොට සවස් යාමයෙහි 'සොම්නස්' නම් යවපාලයා විසින් පිළිගන්වන ලද තණ අටමිට පිළිගෙන න්‍යාග්‍රොධ බොධිමුලයට එළඹ පහලොස් රියන් වජ්‍රාසනයෙහි වැඩ හිඳ යාමත්‍රයෙහි විද්‍යාත්‍රයාධිගමය කොට ප්‍රත්‍යක්ෂයෙහි සවාසනා සර්වකෙලශයන් නසා බුඬ රාජ්‍යයට පැමිණ සත්සති යවා වැඩ සිටි සේක.

එසමයෙහි අප මහ බෝසතාණන් වහන්සෙ 'ජෝතිපාල' නම් මානවකව ඝටීකාර නම් කුම්භකාර මිත්‍රයා සමග තථාගතයන් වහන්සෙ කරා එළඹ බණ අසා සතුටට පත්ව එම බුදු සසුනෙහි මහණව පිළිවෙත් පුරා බුදු බවම පැතුවේ ය. එම පැතුම කාශ්‍යප බුදු රජාණන් වහන්සේ දැන දැක මෙසේ වදාල සේක. මෙම අතුරුකප ගෙවීමෙන් පසු ලබන්නාවූ අතුරුකපෙදී මාගෙන් දෙවෙනිව 'ගෞතම' නමින් බුදු වන්නේය ය. යි විවරණ ශ්‍රී දී වදාළ සේක.

මෙසේ අපගෙ ගෞතම බුදු රජාණන් වහන්සෙ දීපංකර පාදමූලයෙහි පටන් කාශ්‍යප බුදු රජාණන් වහන්සේගෙ ශ්‍රී පාද මූලය දක්වා ලෝ පහළ වූ සූවිසි බුදු රජාණන් වහන්සෙලා හමුවෙ සිඟමන් යදින මහා දුගියන් සේම, මව

සොයන අසරණ වූ දරුවෙක් සේම, රජකම පතන තරුණ කුමාරයෙක් සේම, මාර්ගය සොයන මංමුලාවූ කෙනෙකු මෙන්ද නිදහස සොයන සිරකරුවකු මෙන්ද, පිහිටක් සොයන අසරණයකු මෙන්ද, සතර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි ඇඟ කිලිපොලා යන මහ දුක් විඳ අවසාන ආත්ම භාවයෙන් හය අවුරුද්දක් කිසිවෙකුටත් කළ නොහැකි දුෂ්කර ක්‍රියාකර ඇසතු මූලයෙහි වජ්‍රාසනයෙහි වැඩ හිඳ අවබෝධකලාවූ සඬම්ය සරණ යමි, දහම් සරණ යායුතු

සූවිසි විවරණ කථා නිමි.

ඒකනායක මුද්‍රණාලය
වේයන්ගොඩ.
033 - 2287289